# 2022/04/05 දින පැවති මහාසභා රැස්වීම් වාර්තාව

**2022/04/05 දින පෙ.ව. 09.00 ට නාගොඩ ප්‍රදේශීය සභා රැස්වීම් ශාලාවේදී රැස්වීම පවත්වන ලදී.**

සහභාගී වූ

| | | |
|---|---|---|
| 1. | නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා | ගරු සභාපති |
| 2. | එම්.කේ. ගාමිණී සුසන්ත මහතා | ගරු උප සභාපති |
| 3. | ඒ.එච්.වී. අජිත් කුමාර මහතා | ගරු මන්ත්‍රී |
| 4. | ඩබ්. ජී. නිශාන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 5. | සී.වී. සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 6. | බන්දුල සමන්ත හිරිමුතුගොඩ | ගරු මන්ත්‍රී |
| 7. | එච්.ජී. තරංග සුදර්ශන මහතා | ගරු මන්ත්‍රී |
| 8. | කුමාරගේ වසන්ත මහතා | ගරු මන්ත්‍රී |
| 9. | එච්.කේ.ලක්රුවන් සම්පත් මහතා | ගරු මන්ත්‍රී |
| 10. | එන්.ජී. ගයාන් මධුෂංඛ මහතා | ගරු මන්ත්‍රී |
| 11. | ධර්මසිරි ගනේවත්ත මහතා | ගරු මන්ත්‍රී |
| 12. | පියල් හිරිමුතුගොඩ මහතා | ගරු මන්ත්‍රී |
| 13. | සුභාෂි මධුමාලි ඒකනායක මෙනවිය | ගරු මන්ත්‍රිනී |
| 14. | එඩේරආරච්චි වෙරංග ලක්මාල් මහතා | ගරු මන්ත්‍රී |
| 15. | නාපෙ විතානගේ සමන් මහතා | ගරු මන්ත්‍රී |
| 16. | සී. වනිගරත්න මහතා | ගරු මන්ත්‍රී |
| 17. | ප්‍රියන්තා ගුණසේකර මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 18. | එම්.එම්.දිසානායක මහතා | ගරු මන්ත්‍රී |
| 19. | එන්.ඩබ්. පතිනායක මහතා | ගරු මන්ත්‍රී |
| 20. | විජිත් වීරගුණරත්න සහබන්දු මහතා | ගරු මන්ත්‍රී |
| 21. | කේ.කේ.අයි.නෙරංජලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 22. | කේ.ඒ.සී. දිල්රුක්ෂි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 23. | එච්.එච්. ගයන්ති කුමාරි මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 24. | ඩබ්. කේ. නෙලී මහත්මිය | ගරු මන්ත්‍රිනී |
| 25. | පී.ජී. රංජිත් ජයවීර මහතා | ගරු මන්ත්‍රී |

සහභාගී නොවූ

| | | |
|---|---|---|
| 1. | විලේගේ අමර ධනංජය මහතා | ගරු මන්ත්‍රී |
| 2. | කේ.එච්.එම්.නදීකා දර්ශනී මිය | ගරු මන්ත්‍රිනී |

**01.** ආගම සිහි කිරීම

**2022.04.05** දින මහා සභාව ආරම්භ කිරීමට පළමුව පැමිණ සිටි සියලු දෙනා තම තමන්ගේ ආගම සිහි කිරීමෙන් අනතුරුව මිය ගිය ඥාතීන් රණවිරුවන් සිහිපත් කර විනාඩියක නිශ්ශබ්දතාවයක් පළ කළේය.

**02.** මූලාසනයේ පිළිගැනීමේ කතාව

ගරු උප සභාපතිතුමා ඇතුළු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. අද දින අප රටේ පවතින අර්බුධකාරී තත්වය මත වුවද, අද දින සභා රැස්වීමට සපැමිණි ඔබතුමන්ලා සහ ඔබතුමියන්ලා මම ඉතා ගෞරවයෙන් පිළිගනු ලබනවා.

එහෙමනම් වෙනදා වගේ සභා රැස්වීමේ කටයුතු ආරම්භ කරමු.

**(අ)01. 2022.03.08** දින පැවති මහ සභා වාර්තාවේ නිවැරදි කිරීම් ඇත්නම් ඒවා නිවැරදි කර වාර්තාව ස්ථිර කිරීම.

**(අ)02.** පසුගිය වාර්තාවේ සංශෝධන ඉදිරිපත් කිරීම

නැත.

**2022.03.08** දින පැවති මහා සභාවේ සභා වාර්තාව සභාව පිළිගතයුතු සත්‍ය වාර්තාවක් ලෙස ගරු මන්ත්‍රී විජිත් සහබන්දු මහතා විසින් යෝජනා කළ අතර, ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කිරීමෙන් අනතුරුව ඒකමතිකව සභා සම්මත විය.

**(ආ).** සභාපතිතුමා විසින් කරනු ලබන විශේෂ නිවේදන

නැත.

**(ඇ).** සන්දේශ පෙත්සම් පැමිණිලි ඉදිරිපත් කිරීම

**01.** පළාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත් විසින් **2022.03.10** දිනැතිව යොමු කරන ලද දිවයින පුරා කොස් පැල **100,000** ක් රෝපණය කිරීමේ වැඩසටහන සම්බන්ධ ලිපිය සගත කරන ලදී.

**02.** පලාත් පාලන දෙපාර්තමේන්තුව, දකුණු පළාත විසින් යොමු කරන ලද "හඩට ඉඩක්" ජනතා වැඩසටහන මගින් හදුනාගත් සක්‍රීය ප්‍රජා නායකයන් පළාත් පාලන ආයතනයේ කමිටු සහා ඇතුලත් කිරීමට යෝජනා කිරීම

**(ඈ).** යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න

නැත.

**(ඉ). (1)** යථා පරිදි කල් දී ඇති යෝජනා

ගරු සභාපති නිමල් වික්ටර් නාගොඩවිතාන මහතා ඉදිරිපත් කරන යෝජනා.

නැත.

**ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා පෙ.ව.09.29 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.**

**03. ඉදිරි ගෙවීම් වාර්තාව ඉදිරිපත් කිරීම**

**අංක 01 සිට 30 දක්වා ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව යෝජනා කරමි.**

<u>**2022.04.05** වන දින පවත්වනු ලබන මහා සභා රැස්වීම සදහා ඉදිරිපත් කළ යුතු ගෙවීම් වාර්තා</u>

**1. සභාපති, නාගොඩ ප්‍රාදේශීය සභාව, නාගොඩ**

i. උඩුගම උප කාර්යාලයේ වතුර මීටරය අලුත්වැඩියා කිරීම සඳහා එයාර් වැල් 01ක් මිලදී ගැනීම සඳහා ගිය මුදල ප්‍රතිපූර්ණය කිරීම - රු. 2,065.00

ii. 2022.03.07 දින ප්‍රධාන කාර්යාලයේ පැවති තාක්ෂණික ඇගයීම් කමිටුවට සහභාගී වූ නිලධාරීන්ට දීමනා ගෙවීම (නිලධාරීන් 06 x 500.00) - රු.3,000.00

iii. 2022 මාර්තු මස මන්ත්‍රීවරුන් සඳහා ඉන්ධන ලබා ගැනීමේ බිල්පත -රු.81,000.00

2. **ලංකා පිලිං ස්ටේෂන්, ගා/නාගොඩ**
<u>**2022 පෙබරවාරි මස ඉන්ධන ලබා ගැනීමේ බිලපත්**</u>

| විස්තරය | ලීටර් ප්‍රමාණය (l) | මුදල (රු.) |
|---|---|---|
| PF 7360 කැබ්රථය | ඩීසල් 548 | 66,308.00 |
| LL 7650 කෘ කැබ් රථය | ඩීසල් 165 | 19,965.00 |
| LL 7366 ට්‍රක් ජල බවුසරය | ඩීසල් 150 | 18,150.00 |
| LL 7103 ටිපර් රථය | ඩීසල් 100 | 12,100.00 |
| LO 3592 ජල බවුසරය | ඩීසල් 50 | 6,050.00 |
| RA 8570 ට්‍රැක්ටරය | ඩීසල් 124 | 15,004.00 |
| RA 8570 ට්‍රැක්ටරය | DS 90 ඔයිල් 3l | 2,850.00 |
| PL 7145 ත්‍රී රෝද රථය සඳහා ( ජලභීතිකා රෝග මර්ධනය සඳහා) | පෙට්‍රල් 21 | 3,717.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා | පෙට්‍රල් 25 | 4,425.00 |
| ගබඩා කර තබා ගැනීම සඳහා | 2T ඔයිල් 1 | 750.00 |
| | **එකතුව** | **149,319.00** |

3. **විගණකාධිපති,ජාතික විගණන කාර්යාලය, අංක 306/72, පොල්දූව පාර, බත්තරමුල්ල**
හිඟ විගණන ගාස්තු ගෙවීම - රු.10,000.00

**4. රෙජිස්ට්‍රාර් ජනරාල්, රෙජිස්ට්‍රාර් ජනරාල් දෙපාර්තමේන්තුව, ඉඩම් හා දිස්ත්‍රික් රෙජිස්ට්‍රාර් කාර්යාලය, බලපිටිය**
නාගොඩ ප්‍රාදේශීය සභාව වෙනුවෙන් 2020 දෙසැම්බර් මාසයේ මුද්දර ගාස්තු උප ලේඛන පිළියෙල කිරීමට අදාළ කාර්ය මණ්ඩල දීමනා ගෙවීම -රු. 100.00

**5. ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය, බද්දේගම**
ණය පදනම මත ජලය ලබා ගැනීම වෙනුවෙන් මුදල් ගෙවීම
2022.02.04 - ජල ඒකක 14
2022.02.11 - ජල ඒකක 06
2022.02.14 - ජල ඒකක 06 - රු. 3,510.00

**6. සභාපති, තවලම ප්‍රාදේශීය සභාව, තවලම**

තවලම ප්‍රාදේශීය සභාවේ LL 7119 ටිපර් රථය යොදාගෙන ආදාහනාගාරයේ පස් ඉවත් කිරිම සහ ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් යොදා ගැනීම සඳහා ගාස්තු ගෙවීම -රු.10,970.00

**7. සභාපති, නෙළුව ප්‍රාදේශීය සභාව, නෙළුව**

නෙළුව ප්‍රාදේශීය සභාවේ LL 7049 ටිපර් රථය යොදාගෙන ආදාහනාගාරයේ ඉදිකිරීම් කටයුතු වෙනුවෙන් යොදා ගැනීම සඳහා ගාස්තු ගෙවීම -රු.39,614.00

**8. නීතිඥ හේමන්ත පී.ඩබ්ලිව් විතාරණ මයා, ලේන්බාන් වීදිය, කොටුව, ගාල්ල**

i. L- 16242 දරණ නඩුවෙහි 2022.03.03 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු හා සංශෝධිත උත්තර ප්‍රකාශ සැසඳීමේ ගාස්තු - රු.11,000.00
ii. S.P 164 අංක දරණ නඩුවෙහි 2022.03.24 දින නීතිඥ පෙනී සිටීමේ ගාස්තු - රු. 5,000.00

**9. එල්.එස්.ආර්. විජේතිලක මයා,ගා/නාගොඩ**

නාගොඩ ප්‍රාදේශීය සභා කැකුළු පෙර පාසල පවත්වා ගෙන යනු ලබන ගොඩනැගිල්ල බදු පදනම මත පවත්වා ගෙන යන බැවින් ඒ සඳහා 2022 අප්‍රේල් මස මාසික කුලිය ගෙවීම - රු. 6,000.00

**10. නිව් විජය මෝටර්ස්,ඕරොප්පුවත්ත,ගාල්ල**

PF 7360 කැබ් රථයේ රෝද සඳහා වැල්කරවල් දැමීම සහ වීල් බැලන්ස් කිරීමේ බිල්පත පියවීම - රු. 2,920.00

**11. K.T.R.G උමාල් කිරිඇල්ල මයා, ග්‍රෑන්ඩ් මෝටර්ස්, වදුරඹ.**

252-6478 අංක දරණ කැබ් රථයේ අලුත්වැඩියා කිරීම සඳහා බිල්පත පියවීම රු.797,688.00

**12. පිටිගල කුෂන් වර්ක්ස්, බද්දේගම පාර, ඊරියගහ, උළුවිටිකේ**

252-6478 කැබ් රථයේ ෂීට් කුෂන් කිරීමේ බිල්පත පියවීම - රු.75,500.00

**13. දයානි ට්‍රේඩ් සෙන්ටර්, මාපලගම, ගාල්ල.**

i. මාපලගම වෙළෙඳ සංකීර්ණයේ වැසිකිළි පද්ධතියේ ජලනල අලුත්වැඩියාවට අවශ්‍ය ද්‍රව්‍ය මිල දී ගැනීමේ බිල්පත පියවීම රු. 2,500.00
ii. තණකොළ කපන මැෂින්වල අඩුපාඩු සකස් කිරීම සඳහා කොටස් මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු. 2,525.00
iii. ප්‍රධාන කාර්යාලයේ සෞඛ්‍ය කම්කරුවන් සඳහා අවශ්‍ය උපකරණ මිලදී ගැනීමේ බිල්පත පියවීම - රු. 8,600.00

**14. එස්. බී. ප්‍රින්ටර්ස් ප්‍රයිවට් ලිමිටඩ්, 441/3, කොළඹ පාර, මීගමුව**

ප්‍රධාන කාර්යාලයට අවශ්‍ය මුද්‍රිත ලේඛන ලබා ගැනීම සඳහා - රු. 9,965.00

**15. ලංකා හොස්ට් වෙබ් සොලියුෂන් ප්‍රයිවට් ලිමිටඩ්, මාකොළ පාර, කිරිබත්ගොඩ**

Nagodaps.lk වෙබ් අඩවිය සඳහා Domain Renewal හා space සඳහා වාර්ශික ගාස්තු ගෙවීම - රු. 7,000.00

**16. H.L.K ශ්‍රීනිත් රුක්ෂාන් මයා, සමගිගම, උඩුගම දකුණ, ගාල්ල.**

උඩුගම මහජන පුස්තකාලය සඳහා පුවත්පත් ලබාගැනීම වෙනුවෙන් ගෙවීම 2022 මාර්තු මාසය සඳහා - රු. 6,310.00

**17. A.J.G ස්ටේෂනරීස්, නො 1/10, කොළඹ පාර, කළුවැල්ල, ගාල්ල**

ප්‍රධාන කාර්යාලයට සහ උප කාර්යාල සඳහා අවශ්‍ය A4 ෂීට් මිලදී ගැනීමේ බිල්පත පියවීම ( පැකට් 40 x 1150.00) - රු.46,000.00

**18. M.V ගුණසේන මයා, රත්න රේඩියෝ ඇන්ඩ් සවුන්ඩ්, තල්ගස්වල**

මාපලගම ආයුර්වේද මධ්‍යස්ථානයේ සීලර් යන්ත්‍රය අලුත්වැඩියා කිරීමේ බිල්පත ගෙවීම - රු. 600.00

19. **ඒ.කේ.නිලන්ති සජීවනී,ග්‍රාෆ් ටෙල් කමියුනිකේෂන්, නාගොඩ**

i. 2022 මාර්තු මස පැවති සභාවාරය සඳහා මහජන නියෝජිතයන් වෙනුවෙන් දුරකථන කාඩ්පත් ලබා දීමේ බිල්පත් පියවීම - රු.28,500.00

ii. 2022 මාර්තු මස සභා වාර්තාව පිටපත් 28 ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් හා සභා වාරයට කැඳවීම් ලිපි 26ක් මුද්‍රණය කිරීම වෙනුවෙන් ගෙවීම් - රු. 2,145.00

**20. එම්. ජේ. ජනිත් ඉරේෂ් කුමාර මයා, ඊහළ ලේල්වල, වදුරඹ, ගාල්ල.**

2022.03.08 දින පැවති මහා සභා වාරය වෙනුවෙන් සංග්‍රහ වියදම් බිල්පත - රු. 8,280.00

**21. සඳරු ග්‍රොසරි ඇන්ඩ් ග්‍රයින්ඩින් මිල්ස්, නාගොඩ**

ප්‍රාදේශීය සභාවේ 2022.03.08 වන දින පැවැත්වූ මාසික මහා සභා රැස්වීමේ සංග්‍රහ ද්‍රව්‍ය මිලදී ගැනීමේ බිල්පත - රු. 4,525.00

**22. යශෝධරා රශිනි නාගොඩවිතාන මෙය, " ආනන්දගිරි", නාගොඩ,ගාල්ල.**

සභාපතිතුමාගේ මහජන සම්බන්ධතා නිලධාරී සඳහා දීමනා ගෙවීම (2022 මාර්තු සඳහා) -රු.14,500.00

**23. <u>ගමන් වියදම් (</u>ආයතන රාජකාරි සඳහා)**

**<u>2022 ජනවාරි මස</u>**

| | | | |
|---|---|---|---|
| i. | යූ.වී මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 2,245.00 |
| ii. | චතුරානි පතිනායක මිය | - වැඩ ක්ෂේත්‍ර කම්කරු | - රු. 2,245.00 |

**<u>2022 පෙබරවාරි මස</u>**

| | | | |
|---|---|---|---|
| iii. | යූ.වී මධුර ප්‍රභාත් මයා | - කාර්යාල කාර්ය සහායක | - රු. 1,565.00 |
| iv. | චතුරානි පතිනායක මිය | - වැඩ ක්ෂේත්‍ර කම්කරු | - රු. 1,565.00 |

**<u>2022 මාර්තු මස</u>**

| | | | |
|---|---|---|---|
| i. | කේ. ඩී. එස්. නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරි | - රු. 1,076.00 |
| ii. | ජී. කේ මදුශානි වාසනා මෙය | - කළ. සේවා නිලධාරී | - රු. 880.00 |
| iii. | බී.ඩී. රුවිනි චතුරිකා මිය | - කළ. සේවා නිලධාරී | - රු. 880.00 |
| iv. | ඩබ්.ජේ. ඒ. ශානක මයා | - ආදායම් පරීක්ෂක | - රු. 1,110.00 |
| v. | එම්. ඒ. වසන්ත මයා | - රියදුරු | -රු. 2,100.00 |

**24. 2022 පරිවර්තිත ගමන් වියදම් ගෙවීම (ක්ෂේත්‍ර නිලධාරින් සඳහා)**

<u>පෙබරවාරි මස සඳහා</u>

| | | | |
|---|---|---|---|
| i. | ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4,000.00 |
| ii. | මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6,200.00 |
| iii. | කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5,500.00 |
| iv. | නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5,500.00 |
| v. | අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3,000.00 |
| vi. | සුපුන් නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | -රු. 3,360.00 |

<u>මාර්තු මස සඳහා</u>

| | | | |
|---|---|---|---|
| i. | ඩබ්.ජේ.ඒ.ශානක මයා | - ආදායම් පරීක්ෂක | -රු . 4,000.00 |

| | | | |
|---|---|---|---|
| ii. | මානෙල් සුදර්ශනී මිය | - සංවර්ධන නිලධාරී | - රු. 6,200.00 |
| iii. | කේ.ඒ.එදිරිසිංහ මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5,500.00 |
| iv. | නදුන් ප්‍රමෝද් මයා | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 5,500.00 |
| v. | අනුෂා සමරවික්‍රම මෙය | - තාක්ෂණ සේවා නිලධාරී | -රු . 3,000.00 |
| vi. | සුපුන් නිපුනිකා මිය | - සංවර්ධන නිලධාරී | -රු. 5,420.00 |

<u>පොදු අරමුදල්</u>

**25. A.M.D. පතිනායක මයා, අශේන් කන්ස්ට්‍රක්ෂන්, යටලමත්ත**
මැණික්දොළ කන්ද මාර්ගය JCB යන්ත්‍රය යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම
( මීටර් පැය 40 x 2500) රු.100,000.00

**26. W. අජිත් ප්‍රියන්ත මයා,මලාමුර**
මලාමුර ග්‍රාම නිලධාරී වසමේ සෞඛ්‍ය කාර්යාලය අසළ සිංහගිරිය මාර්ගය සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම (මීටර් පැය 60 x 1300) - රු.78,000.00

**27. පී. චානක රංග, චානක එන්ටර්ප්‍රයිසස්, රැකඩහේන, කහඳුව**

i. ඇප්ත්‍රෝප්වත්ත ඉඩමේ නොදිරන කසළ වල JCB යන්ත්‍රයක් යොදා පස් දමා වසා දැමීම වෙනුවෙන් ගෙවීම (පැය 5 x 2500) - රු.12,500.00

ii. ආදාහනාගාරයේ පිවිසුම් මාර්ගය සකස් කිරීම වෙනුවෙන් ගෙවීම් කිරීම ( iv වන අදියර සඳහා) (පැය 17.7 x 2500) - රු.44,250.00

<u>රජයේ ආධාර</u>
<u>**උපමාන පාදක ( මන්ත්‍රී ප්‍රතිපාදන )**</u>

**28. චමින්ද ඉලෙක්ට්‍රිකල්ස්, මාකාවිට, මාතර**
ගම සමඟ පිළිසඳර 2022 යටතේ
සහා බල ප්‍රදේශයේ අලුත්වත්ත කොට්ඨාසයේ වීදි පහන් සවි කිරීමට අදාළව මිල දී ගන්නා ලද වීදි පහන් කට්ටල 30ක් සඳහා ගෙවීම් කිරීම. (30 x රු.2,980.00) රු.89,400.00
(මේ සඳහා ගෙවීම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් ප්‍රතිපාදන ලැබුණු පසු ගෙවීම් සිදු කරයි.)

**29. කුරගොඩගේ පුලස්ති පත්මසිරි, කැටගොඩ, උඩුගම**
කොතලාවල බොරවකන්ද මාර්ගය JCB යන්ත්‍රයක් යොදා සංවර්ධනය කිරීම වෙනුවෙන් ගෙවීම -රු.22,500.00

<u>රජයේ ආධාර</u>
<u>**පළාත් නිශ්චිත -2021**</u>

**30. චමින්ද ඉලෙක්ට්‍රිකල්ස්, මාකාවිට, මාතර**
මාපලගම නගරයේ ඉදි කරන ලද ළමා උද්‍යානයට විදුලිය ලබා ගැනීමට මිළදී ගන්නා ලද වොට් 100 (orange) බල්බ් 3 ක් සඳහා ගෙවීම් කිරීම (රු. 9,375.00 x 3) රු.28,125.00

ඒ අනුව ඉදිරි ගෙවීම් වාර්තාවේ සදහන් අංක1 – 30 දක්වා ඉදිරි ගෙවීම් සහා අරමුදල් මගින් ගෙවීම සුදුසු බව ගරු සභාපතිතුමන් කල යෝජනාව ගරු මන්ත්‍රී එම්.එම්. දිසානායක මහතා විසින් ස්ථිර කරන ලදුව ඒකමතිකව සහා සම්මත විය.

(ඉ) 2. රැස්වීම් රීති 11(8) යටතේ ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන යෝජනා

01. තල්ගස්වල වෙළඳ සංකීර්ණය ඉදිකිරීම අදියර 1 කර්මාන්තයේ පළමු කොටස් ගෙවීමේ බිල්පත ගෙවීම සඳහා අනුමැතියට ඉදිරිපත් කරමි. (මුදල රු.418561.32)

ගරු සභාපතිතුමා විසින් ඉදිරිපත් කරන ලද ඉහත සඳහන් යෝජනාව ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා විසින් ස්ථිර කරනු ලදුව ඒකමතිකව සහා සම්මත විය.

02. ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම

නැත.

03. මිළ ගණන් ඉදිරිපත් කිරීම

පෙර පාසල් සඳහා උපකරණ ලබා දීම වෙනුවෙන් ලබා දී ඇති මිළ ගණන්

| විස්තරය | කුමුදු නිශ්පාදන, පිලියන්දල | විනෝදා බුක් ෂොප්, මාපලගම | ජේ.පී.කමියුනිකේෂන්, නාගොඩ |
|---|---|---|---|
| පසල් ලොකු | 195.00 | 210.00 | 230.00 |
| පසල් මධ්‍යම | 185.00 | 190.00 | 210.00 |
| පසල් කුඩා | 175.00 | 180.00 | 200.00 |

නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සඳහා උපකරණ ලබා දීම වෙනුවෙන් ලබා දී ඇති මිළ ගණන් අනුව අවම මිළ ගණන් ඉදිරිපත් කොට තිබූ කුමුදු නිශ්පාදන, පිලියන්දල වෙතින් නාගොඩ ප්‍රාදේශීය සභාවේ පෙර පාසල් සඳහා උපකරණ ලබා ගැනීම සුදුසු යැයි ගරු මන්ත්‍රී එම්.එම්.දිසානායක මහතා යෝජනා කරන ලද අතර ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා ස්ථිර කරන ලදී.

ගරු මන්ත්‍රිනී චන්දිමා දිල්රුක්ෂි මහත්මිය, මහතා පෙ.ව.09.45 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.

(ඊ) කාරක සභා වාර්තා

01.2022.03.28 දින පැවති ප්‍රසම්පාදන කමිටු වාර්තාව

(උ). ලැබීම් හා ගෙවීම් වාර්තා

නැත.

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා, ගරු මන්ත්‍රී පියල් හිරිමුතුගොඩ මහතා සහ ගරු මන්ත්‍රිනී ඉනෝකා නෙරංජලී මහත්මිය පෙ.ව.09.50 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.

(ඌ) වෙනත් කරුණු

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. රටේම පවතින තත්ත්වය පිළිබඳ කතා කිරීමේ දී, ප්‍රශ්නය තියෙන්නෙ ඔබතුමාලගේ නෙවෙයි. ඉහල පුටුවල ඉන්න උදවිය ගාව තමයි ප්‍රශ්නය තියෙන්නේ. ඔබ එක කණ්ඩායමක සිට දේශපාලනය කරන නිසා, ඔය හදවත් වලට එම පණිවිඩය ප්‍රකාශ කර ගැනීමේ හැකියාවක් නැහැ. ඒක තමයි දේශපාලනයේ හැටි. අපි 27 දෙනාට පුළුවන් පැය ගානක් මේ සම්බන්ධව කතා කරන්න. නමුත් තමුන්නාන්සේලාට උත්තර බඳින්න බැහැ. අපි උත්තර බැඳගන්න එළියට ගියහම පිළිතුරක් නැහැ. බොරුවට අපි වාද වෙනවා කියන එක තමයි මගේ තර්කය. නමුත් ආණ්ඩුවක් හැටියට ගත්තම ආණ්ඩුව ෆේල්. මේ වෙලාවේ නාගොඩ ප්‍රාදේශීය සභාවේ අපි කණ්ඩායමක් හැටියට, මම දන්නේ නැහැ. මොනදේ උනත් මේ අර්බුදය විසඳන්න එකම විසඳුමයි තියෙන්නෙ. එහෙම නම් රාජපක්ෂවරු මේකෙන් ඉවත් විය යුතුයි. මට හිතෙන විදිහට රාජපක්ෂවරු ඉවත් ඉවත් වුවොත්, මේ රටේ තත්ත්වය වෙනස් වෙන්න පුළුවන්. නමුත් ඒ සඳහා විකල්පයක් තියෙන්න ඕන. සභාපතිතුමාටත්, අපටත් කියනවා. සියලු දෙනාම පලයව් කියලා. නමුත් මේක පාලනය කරන්න විකල්පයක් තියෙන්න ඕන. මම බොහෝ දෙනකුගෙන් ඒ විකල්පය දකින්නෙ නැහැ. මේ වෙලාවේ සිහිබුද්ධියෙන් අපි සියලු දෙනාම කටයුතු කරන්න ඕන. මීට වැඩිය වෙනසක් ඕනේ නම්, අපිටත් අද බෝඩ් ලැල්ලක් අරගෙන මෙතනට එන්න තිබුණා. නමුත් අපි එහෙම ආවෙ නැහැ. මොකද අපි එකට හිටපු මිනිස්සු නිසා. මාධ්‍යයට හොඳ පණිවිඩයක් දෙන්න තිබුණා. නමුත් අපි එතනට ආවෙ නැහැ. උදේට ආහාරයක් නැතුව වැඩට යන මිනිස් කොට්ඨාශයක් තමයි ඉන්නේ. පවතින ආර්ථික අර්බුදයත් එක්ක අපට පවා ආහාර වේලක්වත් වෙනදා වගේ ගන්න නොහැකි තත්ත්වයකට පත්වෙලා තියෙන්නෙ. අම්මාවරුන් දරුවන් තියාගෙන පෙළපාලි යන යුගයක්. ලංකා ඉතිහාසයේ මේ වගේ දෙයක් නිර්මාණය වුණේ නැහැ. අදක්ෂ පාලකයකුගේ ක්‍රියාකලාපය නිසා තමයි, අද මේ දේ වෙලා තියෙන්නේ. පරිප්පු, හාල්, කිරිපිටි, ඇඳුම්, විදුලිය, බෙහෙත්, තෙල්, සිමෙන්ති සියලුම දේ නැහැ. මෙහි අගමුල සෙවිය යුතුයි. ගම්වල මිනිස්සු දර කැල්ලක් හදාගෙන හරි උයාගෙන කනවා. නමුත් නගරවල මහල් නිවාසවල ජීවත්වන මිනිස්සු අන්ත අසරණ වෙලා තියෙනවා. මූලික අයිතිවාසිකම් ටිකවත් ඉෂ්ට සිද්ධ කර ගන්න බැරිව. මේ මිනිස්සු ඩොලර් නැහැ කියනවා. නමුත් අද ගම්වල මොනවද බෙදන්නේ නැත්තෙ. කුල් පැටව් බෙදනවා. හරක් පැටව්, එළු පැටව් දෙනවා. දෙන්න දෙයක් නැහැ. කපරාරු ගහපු බිත්ති ගලවලා නැවත කපරාරු ගහන්න කියලා ලක්ෂ ගණන් බෙදෙනවා. එහෙම නම් මේ සල්ලි රුපියල් ශත නේද දැන් ඔන්න රුපියල් 5000.00 ක් දෙනවා කියනවා.

ඩොලර් දීල බඩු ගෙන්නන්නේ නැතුව, මේ රුපියල් සත ටික එකතු කරලා අපේ රටේ ආර්ථිකය ශක්තිමත් කරන්න තිබුණා. වෙළඳ පළට යනවා. මාළු ටික මිලදී ගන්නවා රුපියල් ශත වලින්. ධීවර සංස්ථාව ඒකට තියෙනවා. වී මෝලට යනවා. වී ටික මිලදී ගන්න රුපියල් ශත වලින්. ඒක ස.තො.ස හරහා බෙදා දෙන්න තිබුණා. දැන් හාල් රුපියල් 250/= යි. කැඳ ටික බොන්න විදිහක් නැහැ. හාල් ටික කඩෙන් ගන්න කෙනෙක් විදියට මම මේ කතා කරන්නේ. රාජ්‍ය සේවකයා එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවෙන් වැඩිකරලා දීපු රුපියල් 12,500 නිසා ජීවත් වෙනවා. අද තමුන්නාන්සේලාට දැනෙනවා ඇති. මෙතනට එන විට මේ වෙනස. මේවා බෙදන්නේ නැතිව නවත්තලා, මේ විදිහට බඩු මිලදී අරගෙන සහන මිලට භාණ්ඩ ටික බෙදුව නම්, සමස්තයක් හැටියට කාටත් ලාභය ලැබෙනවා. මේක

තමයි වැරැද්ද. බලලෝභීත්වය තවදුරටත් රැඳී නොසිට, ජනතාව ඉල්ලන දේ දෙන්න. ජනතාව ඉල්ලන්නේ කුසගින්නට. මේ ගින්නට එහා තවත් ගින්නක් නැහැ. අද හැම නගරයකම ඒකාකාරයි. එයාලගේ කෑම මේසේ හැම කෑමක්ම තියෙනවා. කිසිම අඩු පාඩුවක් නැහැ. ඒ වගේම අපේ විජිත් මහත්තයා රුපියල් පනස් දාහක් දීලා පොහොර හොන්ඩර ගෙනාවලු. ගෝඨාභය මහත්තයෝ රටට වද නොදී, දැන් රාජපක්ෂවරු කෑවා ඇති. කරුණාකරල යන්න. සාධාරණ සමාජයක් බිහිකිරීම සඳහා මෙයින් ඉවත් වන ලෙස ප්‍රකාශ කරමින්, ඔබ සියලු දෙනාටම කිසිදු අපල උපද්‍රවයක් වෙන්න එපා කියා ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මන්ත්‍රී රංජිත් ජයවීර මහතා

ගරු සභාවෙන් අවසරයි. ඇත්තටම සභාපතිතුමනි, තල්ගස්වල පොල සම්බන්ධව කතා කරද්දි, සතිපොළේ කඩ කාමරවල සිමින්ති වගයක් දාලා තියෙනවා. නමුත් ඒව දාල තියෙන්නෙ කොලප්පු වගේ. ඒවා ගැලවී ගැලවී යනවා. ඒ වගේම උඩහට පාරක් කැපුවා වාහන දාන්න කියලා. නමුත් තවම කාණු පද්ධතිය සකස් කරලා නැහැ. වාහනයක්වත් දාන්න බැහැ. ඒ වගේම පොළ ඇතුලෙ තියෙන වීදි ලාම්පු පත්තු වෙන්නේ නැහැ. ඊට අමතරව මාපලගම ක්‍රීඩාංගනයේ ගේට්ටුව ගැලවෙන්න ළඟයි. මම හිතන්නේ සභාවේ කම්කරුවන් යොදවලා තමයි හදන්න හදන්නේ. ඒ සියලු කාරණා සිහියට අරගෙන කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය, ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා සහ ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා පෙ.ව.10.05 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.

ගරු මන්ත්‍රිනි ඉනෝකා නෙරංජලී මහත්මිය

ගරු සභාපතිතුමනි, සියලු මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. මම මේ අවස්ථාවේ නැගී සිටියේ, මගේ අදහස් කිහිපයක් ප්‍රකාශ කරන්න. ඉතිහාසයේ කිසිදු දිනෙක ඇසූ විරූ නොවූ දේවල් තමයි සිදු වෙන්නේ. පසුගිය මාසයට කලින් මාසයේ මම කිව්වා. ආහාර හිඟතාවයක් ඉදිරියට සිදු වෙයි. ඒ සම්බන්ධව සොයා බලන්න කියලා. නමුත් ඒ අවස්ථාවේදී ප්‍රියන්තා මන්ත්‍රීතුමිය කිව්වා. එහෙම වෙන්නේ නැහැ. ඉදිරියට ඕනවටත් වඩා ආහාර තියෙනවා. අපේ ගෙදර වුණත් එන්න කියලා. ඉතින් අපේ තියෙන පීඩනය නෙවෙයි. උද්ඝෝෂකයෝ ඔවුන්ගේ පීඩනය තමයි පිට කරන්නේ. නැවත කියන්න දෙයක් නැහැ. රූපවාහිනී වල යන දේවල් තමයි නැවත නැවත කියන්න තියෙන්නේ. දරුවෝ කිරි පිටි නැතුව අඩනවා. අම්මලා විදුලිය නැතුව කෑගහනවා. සමස්ත සමාජය එක දාමයකට තමයි කරකැවෙන්නේ. ඉතිහාසයේ ගංවතුරක් ගැලුවා. ඒ වගේම සුනාමිය ආවා. අපේ ජීවිත කාලය තුළ මෙවැනි දේවල් අපේ වැඩිහිටියෝවත් දැකලා නැතුව ඇති. එවැනි අවාසනාවන්ත දේවල් වලට තමයි අපිට මුහුණ දෙන්න වෙලා තියෙන්නේ. සාගතයක් ඇවිල්ලා තියෙන්නෙ. ඒකයි අද උද්ඝෝෂකයන් සභාව ඉදිරියට ඇවිල්ල තියෙන්නේ. මීට පෙර අපි ඉදිරියට ආවේ පොහොර ප්‍රශ්නය සම්බන්ධයෙන්. එදින ඔබතුමා වේලාසනින් සභාව අවසන් කරලා තිබුණා. පොහොර ප්‍රශ්නය සම්බන්ධව අපි යමක් මුලින් ප්‍රකාශ කළා. නමුත් දැන් රටම ඊට එරෙහිව මන්ත්‍රී වරුන්ට විරුද්ධව නැගී සිටිනවා. නමුත් රනිල් වික්‍රමසිංහ මහතා වේලාසනින් කිව්වා මෙහෙම ආර්ථික අර්බුදයක් මෙවැනි ව්‍යසනයක් ඇති වෙයි කියලා. නමුත් ඒ වහපු නැති එකේ පලවිපාක තමයි දැන් මේ සිද්ධ වෙන්නේ. මම මීට වඩා කතා කරන්න බලාපොරොත්තු වෙන්නේ නැහැ මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

ගරු මන්ත්‍රී චන්ද්‍රසිරි වනිගරත්න මහතා

ගරු සභාපතිතුමනි අවසරයි. රටේ පවතින තත්වය පිළිබඳව විශේෂයෙන් ම අවධානය යොමු කළ යුතු අවස්ථාවක්. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා බලයට පත් කරන අවස්ථාවේ මේ මිනිස්සුන්ගෙ මතයක් තිබුණා. බුද්ධිමතුන් ඒකරාශී කරගෙන මේ ගමන යන්න ඕන කියන මතය. ඒ පිරිසත් සූදානම් කරගෙන මේ ගමන යන්න සැලසුනා. මේකෙ මම දකින්නේ නායකයෝ හැටියට සියලු දෙනා ආදර්ශයට ගත යුතු අවස්ථාවක්. සියලු දෙනා කියන්නේ මේ 225ම යන්න ඕන කියලා. හොඳම ආදර්ශය ගන්න ඕන කියන්න සභාපතිතුමාට නායකයෝ සියලු දෙනාටම මේක හොඳ පණිවිඩයක්. හැම නායකයෙකු ප්‍රශ්නයට මුහුණ දෙන්න සිදුවෙනවා. මෙම ප්‍රශ්නය උග්‍ර වුණේ මෙතුමාගේ කාලේ උපරිම මට්ටමෙන් කටයුතු කරන්න ගිය නිසා. අපි මොන තරම් කරන පිරිස වුනත් වැඩක් නැහැ. තමන්ගේ අදහස් නායකයින්ට ඉදිරිපත් කරන්න බැරිනම් , මෙම අදහස් ප්‍රකාශ කිරීමේ අයිතිය එකම දේශපාලන පක්ෂයකටවත් ඇත්තෙ නැහැ. බලයට පත්වුණ සෑම නායකයෙකුගේ ම අතින් සිදුවුන වැරැද්දක් තමයි මේක. නායකයින්ටත් වඩා වගකියන්න ඕන, නායකයෝ වටේ ඉන්න උපදෙස් දෙන පිරිසෙන්. විපක්ෂය විසින් අදහස් දුන්නම, ඒවා විපක්ෂයේ මතය කියලා, ඒවා ප්‍රතික්ෂේප කරන ඉහළ නිලධාරීන් ඉන්නවා. මම හිතන්නේ සමස්ත ක්‍රමයේම වෙනසක අවශ්‍යතාවයක් අවශ්‍යයි. ජනතාව කියන්නේ ඒකයි. ජනතාවගේ හඬට ඇහුම්කන් නොදුන්නොත්, බලයක් තිබුණත් 69 ලක්ෂයේ බලය තිබුණත්, මීට වඩා ඉහළ බලයක් තිබුනත්, ජනතා හඬට ඇහුම්කන් දෙන්න. දැනුවත්ව නොදැනුවත්ව ඒ මහජනතාවට දැනිච්ච දේ ඒ ජනතාවට වගේම අපි හැම මන්ත්‍රීවරයෙකුටමත් මේ ගැටලුව තියෙනවා. ඒ නිසා සමස්ත ක්‍රමයේම වෙනසක් අවශ්‍යයි. මේ වෙලාවේ විකල්පයක් හැටියට, සියලුම දෙනා කියන්නේ, රාජපක්ෂ පවුලේ සියලු දෙනාම යායුතුයි කියලා. අපිත් ඒක කියන්නම්. නමුත් විකල්පයක් හැටියට මේ රට බාර ගන්න ඉදිරිපත් වෙලා , මම මේක කරන්නම් කියලා කියන්න කෙනෙක් නැහැ. එහෙම පෞරුෂයක් තියෙන නායකයෙක් ඇත්තෙත් නැහැ. අපිට පෙනෙන නායකත්වය තුළ මේ දේවල් ඇත්තෙත් නැහැ. ඒ නිසා බොහොම අවිනිශ්චිත තත්ත්වයක් තුළ මම මේ වෙලාවේ අදහස් දැක්වූයේ, එක් පක්ෂයකට නැඹුරුතාවයක් දක්වන්න නෙවෙයි. මේ වෙලාවේ රටේ හිටපු සියලු නායකයින්ටත්, සිටින නායකයින්ටත් අපි හැමදෙනාටම, මිනිස්සු දෙන පණිවිඩය තමයි, උඹලා අපි එච්චට අපට පීඩනය දෙන්න ආවොත්, අපි උඹලත් යවනවා කියන පණිවිඩය. මිනිස්සුන්ට බරපතළ ප්‍රශ්නයක් තියෙනවා. පෙට්‍රල් ටික නැති වුණහම, විදුලිය නැති වුණාම අපටත් ඉතා බරපතළ විදිහට දැනෙනවා. මම දකින්නේ මේ වෙලාවේ නායකයින් සියලුම දෙනා පිළිගන්න පුළුවන් ක්‍රමවේදයක් සකස් කර රට යන්න පුළුවන් ක්‍රමවේදයකට රට වෙනස් කිරීම හැර වෙන කිසිවක් නැහැ. මම අදහසක් ලෙස ඉදිරිපත් කළේ රටේ උද්ගතවී ඇති තත්ත්වය තුළ නිහඬව ඉන්නවට වඩා, අපේ අදහස මේකයි කියන කාරණය වැදගත් යැයි මතය මම අදහස ප්‍රකාශ කළේ. මේ අවස්ථාවේ ඇතිවී ඇති අර්බුදකාරී තත්ත්වය විසඳා ගැනීමට අවශ්‍ය ශක්තිය, ධෛර්යය නායකයින්ට ලැබේවායි පතමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මන්ත්‍රී අජිත් එඩේර ආරච්චි මහතා

ගරු සභාපතිතුමා ප්‍රමඛ සභාවෙන් අවසරයි. රටේ ඇතිවී ඇති අර්බුදය සම්බන්ධව අපේ මන්ත්‍රීවරු කිහිප පළක් මේ අවස්ථාවේ කතා කරලා අවසන් වුන මේ වෙලාවේ, සියලු දෙනාගේ අදහස් පිළිගන්නවා හැර, ප්‍රතික්ෂේප කිරීමට හැකියාවක් නැහැ. අද හැම පැත්තෙන්ම සිදුවන සිදුවීම් දිහා බැලුවම, ඒ බව සනාථ වෙනවා. හිටපු අගමැති රනිල් වික්‍රමසිංහ මැතිතුමාගේ එක්තරා ප්‍රකාශයකින් අපි කතාව පටන් ගන්නවා නම්, එතුමා පසුගිය දිනයකදී කියපු කතාව මම අහගෙන හිටියා. අපේ රටේ පාලකයන් සහ

ඔවුන් කරන කතා දිහා බැලුවම, සමහර විට විජය රජ්ජුරුවෝ අපේ රටට ආවේ නැත්නම්, මේ කිසිම ප්‍රශ්නයක් ඇති වෙන්නේ නැහැ කියන එක තමයි එතුමගෙ තර්කය.

හැම ආණ්ඩුවක්ම එකිනෙකාට ආපස්සට පැවති ආණ්ඩුවලට වැරදි පටවලා, හැම කෙනාම නිවැරදි වෙන්න උත්සාහ දරනවා. අවසානයේ ඉන්නේ විජය රජ්ජුරුවෝ. එතුමා පිරිසක් එක්ක මේ රටට නාවනම්, මේ කිසිම ගැටළුවක් ඇති නොවෙන්න තිබුණා. ඒකයි අද මම කතාව එතනින් පටන් ගන්නවා කිව්වේ. ඒ නිසා මිත්‍රවරුනි, අපි එකිනෙකාට ඇඟිල්ල දිගු කරගැනීම නෙවෙයි වෙන්න ඕන. මේ රට රටක් හැටියට ගෙන යන්න සියලු දෙනා එක්ව වැඩ පිළිවෙළක් සාකච්ඡා කරනවා. එක පැත්තකින් රාජපක්ෂ පවුලටම ගෙදර යන්න කියන එක ගැන මගේ ප්‍රසාදයක් නැහැ. මගේ තර්කය රාජපක්ෂ පවුල ඉන්න ඕන කියන කාරණය මත නෙවෙයි. රාජපක්ෂ පවුල යනවනම්, යම්කිසි නායකයෙක් සිටිය යුතුයි. ප්‍රජාතන්ත්‍රවාදීව කටයුතු කිරීමේදී අපි අපේ ව්‍යවස්ථාවට අනුව කටයුතු කළ යුතුයි. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සම්මත වෙච්ච මේ නීති රීතීන් ට අවස්ථාව ලබාදිය යුතුයි. ගෙවල් වලට කඩාපනින පිරිස්, උද්ඝෝෂණය කරන සහ සාමකාමීව පෙළපාලි යන පිරිස්, ඒ අය කටයුතු කරන්නේ නීතිය කියන කාරණය කිසිසේත් සැලකිල්ලට නොගෙන. එහෙම නීතියට පිටින් ගිහිල්ලා, පාලකයන් පලවා හැරපු රටවලුත් තියෙනවා. ඒවට උදාහරණ නැතිවා නොවෙයි. මේ ආකාරයෙන් ප්‍රශ්නයක් නිර්මාණය වෙච්ච වාතාවරණයක් තුළ, අපි ආණ්ඩුවට යන්න කියනවා නම්, ආණ්ඩුවේ පාලක පක්ෂයට, අපි විකල්පයක් සූදානම් කර තිබිය යුතුයි. උදාහරණ වශයෙන් මම ශ්‍රී ලංකා නිදහස් පක්ෂය නියෝජනය කරන මන්ත්‍රීවරයෙක් හැටියට, සභාව නියෝජනය වෙන්නේ. මම මීට පෙර සභාවාරයට කලියෙන් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට විරුද්ධව දෝෂාරෝපණයක් ඉදිරිපත් කලා. වාර්තාවෙ තිබුණා. අද ඊයේ වෙනකොට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය තීන්දුවක් ගන්නවා. ආණ්ඩුවෙන් ඉවත් වෙලා, ස්වාධීන වෙනවා කියලා. ගරු සභාපතිතුමනි, ඒක විහිළුවට ලක් වෙච්ච කාරණයක් හැටියට තමයි මම දකින්නේ. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ගත් අමනෝඥ ක්‍රියාවක් හැටියට ඉතිහාස ගත වන කාරණාවක්. මෙතුමා ප්‍රකාශ කළා වගේ හවුල්කාර පක්ෂවලට යුතුකමක් තිබුණා. ආණ්ඩුව නිවැරදි කරන්න. එහෙමනම් කාල්ටන්, මිරිහාන වටලන්නේ නැහැ. ගාල්ලේ රමේෂ් පතිරණ මහත්තයාගේ ගේ වටලන්නෙ නැහැ. අද සභාව ඉස්සරහට එන්නේ නැහැ. ඒ ගතයුතු ක්‍රියාමාර්ග නොගත් හවුල්කාර පක්ෂ සහ ඒ අවශ්‍ය තීන්දුව ඒ අවශ්‍ය වෙලාවේ අරගෙන තිබුනෙ නැහැ. මොකද මීට කලින් අයින් විය යුතුව තිබුණේ. ගෑස් ප්‍රශ්නය මීට කලින් ආවෙ. විදුලි ප්‍රශ්න, ඩීසල් ප්‍රශ්න ආවේ අද නෙවෙයි. එම ප්‍රශ්න මුලදී එනවිටම ජනාධිපතිතුමා ඇතුළු ඇමති මණ්ඩලයට බලපෑමක් ඇති කරන්න තිබුණා. මේ මහජනතාව උද්ඝෝෂණ කරන්න කලියෙන්. මේක ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ජනතා උද්ඝෝෂණ වලට බයේ, ජනතාව ඒ අයට වඩා ප්‍රබල ව ඉන්න නිසා, ඒවට තැතිගෙන ඒගොල්ලන්ට කරන්නම දෙයක් නැති තැන විලි ලැජ්ජාවෙ ඉන්න බැරිකමට, ආත්ම ගරුත්වයක් නැතිකමට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ස්වාධීන වෙන්න තීන්දු කළා ය කියන කාරණය මම මේ සභාවේ වාර්තාගත වෙන්න ප්‍රකාශ කරන්නේ. විශේෂයෙන්ම සඳහන් කළ යුතුව තිබුණා. ඒ අයට පුළුවන් ආණ්ඩුව නිවැරදි කරන්න. පරිණත දේශපාලඥයන්, ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ඉන්නවා. මෛත්‍රීපාල සිරිසේන මහතා, නිමල් සිරිපාල ද සිල්වා මහතා පරණ මිනිස්සු. ඒ ආදී වශයෙන් නායකයෝ මෙහෙ ඉන්නවා. ඒ අයට දැක්මක් තිබුණා. මේ යන ගමන පේනවා. මේක නිවැරදි කරන්න, ඒ අවශ්‍ය වෙලාවෙදි එහෙම කළේ නැහැ කියලා මම මේ වෙලාවෙදි මතක් කරනවා. රොෂාන් රණසිංහ මැතිතුමාගේ ඉල්ලා අස්වීම සලකන්නෙත් මම ඒ ගානට. ඒ විතරක් නෙවෙයි. ලංසා ඇමතිතුමාගේ ඉල්ලා අස්වීම සලකන්නෙත් මම ඒ ගානට. රොෂාන් රණසිංහ මහත්තයට එහේ උතුරුමැද පොළොන්නරුවේ ගොවියෝ ඉන්නේ තනිකර ගොවියන්ගේ ඡන්දවලින් ආපු මිනිස්සු. නගරයේ ඉන්න බිස්නස් කාරයෝ කිහිප දෙනෙක් ඇරෙන්න, අනෙක් හැමෝම ගොවියෝ. ඒ අයට ගොවියන් වෙනුවෙන් ඒ වෙලාවේ ඒ තීන්දුව ගන්න තිබුණා. කොන්ද

කෙලින් තියාගෙන ආණ්ඩුවට බලපෑමක් කරන්න තිබුණා. එහෙනම් ජනාධිපති යම් ප්‍රමාණයකට පාලනය කරගන්න තිබුණා. නව ජනවරමක් ගන්න ආණ්ඩුව ජනතාව ගැන හිතලා යම් තැනකට තල්ලු කරන්න තිබුණා. ජනාධිපති උද්ධච්ච නම් එය තුනී කරන්න තල්ලුවක් දෙන්න තිබුණා.

විපක්ෂයට චෝදනා කරනවට වඩා අපි චෝදනා කළ යුත්තේ ආණ්ඩුවේ ඉන්න හවුල්කාර පක්ෂවලට. ඒ අයටයි මේ 2/3 ඡන්ද බලයක් දීලා තියෙන නිසා, ඔවුන්ට ව්‍යවස්ථාව වෙනස් කරන්න බලය දීලා තියෙනවා නම්, ඕනෑම කටයුත්තක් කරන්න ජනවරම ලබා දීලා තියෙනවා නම්, ඒ ජනවරම නිසි පරිදි ක්‍රියාත්මක කරනවා නම්, විපක්ෂයට ඇඟිල්ල දික් කරන්න අවශ්‍ය වෙන්නේ නැහැ. කාරණය මම විශේෂයෙන් මතක් කරනවා. ඒ නිසා තමයි. මම දුරදිග ගිය කාරණාවක් ලෙස දක්නට ලැබෙන්නේ. අවශ්‍ය වෙලාවට අවශ්‍ය තීන්දු තීරණ නොගත්ත නිසා මේ දේවල් මේ විදිහට වෙලා තියෙනවා. මේ ආණ්ඩුව ජනාධිපතිවරයා පත් කරලා, මහ මැතිවරණය ඉඳලම මැතිවරණ ක්‍රියාවලිය සිද්ධ වෙච්ච දවසේ ඉඳලම මේක දැක්කා. මේක යන විදිහ අපට තේරුණා. අපේ ආණ්ඩු පක්ෂ මන්ත්‍රීවරු දන්නවා මැතිවරණය දිනලා, මහමැතිවරණය ළඟම එනකොට, ශ්‍රී ලංකා නිදහස් පක්ෂය සහ පොදුජන පෙරමුණ පොහොට්ටුව ලකුණින් මහ මැතිවරණයට ඉදිරිපත් වුණේ. ඒ ඉදිරිපත් වෙනකොට, අපේ සහෝදර මන්ත්‍රීවරු සියලු දෙනාම, අලුත් වත්ත ප්‍රදේශ උඩුගම එදා ඉඳලා අපේ ප්‍රදේශයේ ගෙවල් වලට දෙතුන් වතාවකට වැඩිය ගොඩවෙලා ඇති. මොකද මළ ගෙවල්, දාන ගෙවල් වලට. හැබැයි ඒ වෙලාවේ ඒ සබඳකම් පසෙකට දාලා, අපේ අපේක්ෂකයෝ මේ තරගයට ඉදිරිපත් වෙනවා. එකම ලකුණින්. නමුත් අපට පොහොට්ටුවේ රැස්වීමකට යන්න දෙන්නෙ නැහැ. අපට සංවිධානය කරන්න දෙන්නෙත් නැහැ. නමුත් එක ලකුණින් ඡන්දය ගන්නවා. තවම අවුරුදු එකහමාරක කාලයක් විතර වගේ. නමුත් මේ උද්ධච්චකම, මහන්තත්තකම ඉහළ ඉඳලා පල්ලෙහාට ඒකාකාරීව තිබුණා. අපේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට අපි දොස් කියනවා නෙවෙයි. ඒ අය ගම් වල ප්‍රධානීන්, පොහොට්ටුවෙ ප්‍රධානීන් මේ අය කොටු කළා. අපට එන්න දෙන්නෙත් නැහැ. අපේ අපේක්ෂකයෙක් ගෙනියන්නත් බැහැ. ඒ අයගේ අංකයක් කියන්නත් බැහැ. ඒ විදිහට විතරක් නෙවෙයි මොනයම් හේතුවක් නිසා හෝ අද වීදි බහින ජනතාව එදා මේ ආණ්ඩුවට සහය දැක්වූ ජනතාව, මේ ආණ්ඩුවට අවුරුදු 1 ½ කට කලින් සහාය දැක්වූයේ එහෙමයි. අපෙන් ගිහිපු අය ඉතිහාසයෙ කොච්චර ආඩම්බර විදිහට, උද්ධච්ඡ විදිහට ඉහළ ඉඳලම පහලට ගලාගෙන යන ස්වරූපයක් දක්නට ලැබෙන්නේ. බලය කවදාක්වත් අපේ අතින් ගිලිහෙන්නේ නැහැ කියලා. එක වගේ ඉහළ ඉඳලා පහළට යනකම්ම බලය සදාකාලිකයි කියලා කල්පනා කලා. ඒ උද්දච්ච සිතුවිල්ලෙන්, ඡන්දය දිනලා ආණ්ඩුව පත් කර ගත යුතුව තිබුණ මිනිස්සු රාජ්‍ය ඇමැතිවරු ලෙස පත් කර ගන්නෙ නැහැ. ඔබතුමාලා පිළිගනීවි. ඔය පත් කර ගත්ත අය අතර සුසිල් ප්‍රේමජයන්ත කියන්නේ අත්දැකීම් බහුල, මොනතරම් දේශපාලන ගැටළු වලට මුහුණ දුන්න කෙනෙක් හැටියට හා අධ්‍යාපන ඇමතිවරයෙක් හැටියට, පෙට්‍රෝලියම් ඇමැතිවරයා හැටියට, විවිධ අමාත්‍යාංශය දරපු ඒ වගේම නීතිඥයෙක් හැටියට, කොළඹ උසාවිවල විශාල පරිචයක් තියෙන මහා විශාල දේශපාලන අත්දැකීම් සහිත හොඳ විචාරකයෙක්, දේශකයෙක් හොඳ කරුණු සහිත පුද්ගලයෙක්. ඒ සියල්ල තිබියදී සුසිල් ප්‍රේමජයන්ත වැනි එතුමන්ලා වගේ අය යහපාලන ආණ්ඩුවක් එක්ක එකතුවෙලා, ඇමතිකම් කරපු පාපයට, එතුමන්ලා කැබිනට් එකට ගන්න කටයුතු කළේ නැහැ. ඒ වගේ දක්ෂයෝ ගණනාවක් මග හරින්න කටයුතු කළා. බලන්න හදාගත්තු කැබිනට් එකේ මොන තරම් නවකයො ඉන්නවද කියලා. වැඩිපුර නවකයො වැඩි වුනාම කරගෙන යන්න අපහසුයි. මොකද අත්දැකීම් අඩු නිසා. රාජ්‍ය ඇමතිවරු පත්කළා. ඒ අය තෝරාගන්නේ ඇමතිවරුන්ගෙන්මයි. වෙනම අමාත්‍යාංශයක් හා පහසුකම් දීලා, වෙනමම වැඩ කරන්න කටයුතු කළා. ඒ නිසා ආණ්ඩුවට මේ වගේ විනාශකාරී තත්ත්වයකට ගොදුරු වෙන්න සිදු වුණා. ඒ නිසා පී බී ජයසුන්දර වගේ ජනාධිපති ලේකම්වරු එක්කෙනෙක්වත් මේ දේශපාලනය කරපු මිනිස්සුන්ට ලන්වෙන්න දුන්නේ නැහැ.

දේශපාලන ප්‍රවාහයේ බලවතුන්ට ලං වෙන්න දුන්නේ නැහැ. වීරවංශලා, ගම්මන්පිල වැනි මිනිස්සුන්ට ආණ්ඩුවෙන් කපලා දැම්මා. ඒ නිසා ආණ්ඩුව එදා ඉදලම ක්‍රියාත්මක වුනේ ජනතාව, අපි කරන ඕනම දෙයක් ප්‍රතික්ෂේප කරන්නේ නැහැ. විරුද්ධ වෙන්නේ නැහැ. විරුද්ධ වෙන්න පුළුවන් කමක් නැහැ. අපි විරුද්ධ වෙන්න දෙන්නෙත් නැහැ කියන අපි කරන දේ ම විතරයි හරි කියන මතයෙන් ම පමණයි කටයුතු කළේ. ඒකයි අද මේ තත්ත්වයට මේ අයට මුහුණ පාන්න වෙන්නෙ. දැන් කරන්න තියෙන්නේ මේකෙන් උපදෙස් අරගෙන, අවබෝධයක් අරගෙන, දැන් රටේ හැටියට දේශපාලනයට මොනවා වුනත් අපි රට ඉස්සරහට යන්න ඕන. හැබැයි අද මේ උද්ඝෝෂණ ඇතුලේ නොගැලපීමක් අපට දක්නට ලැබෙනවා. සමහර උද්ඝෝෂණ ජනතා විමුක්ති පෙරමුණ සහ සමගි ජන බලවේගය ඇතුල් වෙලා මෙහෙයවනවා. සමහර උද්ඝෝෂණ සිවිල් ජනතාව පමණක් කරනවා. විවිධ ස්වරූපයේ උද්ඝෝෂණ සිදුවෙනවා. මේ තත්ත්වය හොඳ නැහැ. මෙම තත්ත්වයෙන් අපට හොඳ පණිවිඩයක් දෙනවා. ප්‍රාදේශීය පාලකයෝ විදිහට අපේ මිත්‍රවරුන්ට මතක තියේවි. කවදාහරි අනාගතයේදී මොන පක්ෂවල ආණ්ඩුවක් බිහි වුවත්, මේ නීරස අත්දැකීමට මුහුණදෙන්න වේවි. පූර්වාදර්ශයක් දුන්නා. හැදෙන ඕනම ආණ්ඩුවකට කරන්න දෙන්නෙ නැහැ. ආණ්ඩු හදන්න බලාපොරොත්තු වෙන අයට කියන්න ඕන. ඉස්සරහට මේ අභියෝගයට මුහුණ දෙන්න වෙනවා කියලා. සියලු දෙනාම නීතියට යටත් විය යුතුයි. මේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපති බලතල අනුව, හදිසි නීතිය ක්‍රියාත්මක කළ හැකි වුවත්, එහි බරපතළකම දන්නෝ දනිති. හැබැයි ඔයිට වඩා දාන්න ආණ්ඩුවකට දෙයක් තියෙනවද? පාරට ජනතාව බැස්සොත්, ඒ දෙකම මායිම් කලා ද? මිනිස්සු තියෙන ආණ්ඩුවට වඩා පරිස්සම් වෙන්න ඕන. අපේ ජයවීර මන්ත්‍රීතුමා කිව්වා බස් එකක් ගිනි තියනවා දැක්කා කියලා. ඒකටත් ඔහු චෝදනා කළේ ආණ්ඩුවට. කොහොම වුණත් වෙච්ච දේ වුණා. මොන ක්‍රමවේදයකින් හරි රාජ්‍ය දේපල විනාශ වුණා. නමුත් ඒ දේ කළ පුද්ගලයා හඳුනාගන්න බැරි වෙලා තියෙනවා. ඒ වෙනුවෙන් ජනතාවගේ සහාය පතල තියනවා. ලක්ෂ 380 මිරිහානෙ දේපල හානිය. බස් පුච්චන එක , මේවා නිකම්ම ඇති වෙච්ච දේවල් නෙවෙයි. මේවටත් පූර්වාදර්ශ සපයලා තියෙනවා. කාපට් කරපු පාරවල් ගිණි තිබ්බම හානිය සහ අලාභය කොච්චරක්ද? ඒ වගේම 88 /89 කාලේ අශෝක ලේලන්ඩ් බස්, සීටීබී බස් 543ක් දේශප්‍රේමීන් විසින් ගිණිබත් කලා. තුනී ලැලි සංස්ථාව ගිණිබත් කලා. වැඩපලවල් සුන්නද්දූලි කරලා දැම්මා. දේශප්‍රේමීන් විසින් මිනිස්සුන්ගෙ රැකියා අහිමි කලා. ට්‍රාන්ස්ෆෝමර් 73 ක් විදුලි කණු 247 ක් කැඩුවා. අද වගේ අස්සක් මුල්ලක් නැරම විදුලිය තිබුණේ නැහැ. එක්සත් ජාතික පක්ෂයේ මන්ත්‍රීවරු සභාපති වරු වෙලා හිටිය නම් අයින් වෙන්න කිව්වා. එහෙම අයින් නොවුනොත් අයින් වෙන්න වෙලාව දුන්නා. පවුල් පිටින් ඝාතනය කලා. ඡන්දපොළට එන පළවෙනි දහ දෙනාගේ අත් කපනවා කිව්වා. අත් කැපුවා. මැරුවා. දනට උඩින් මිනීපෙට්ටිය ගෙනියන්න එපා කිව්වා. එහෙම ගෙනිහිල්ලා භූමදානය කළා. අද අහිංසක දූ දරුවන් ගැන, කඳුළු හලන මිනිස්සුන්ට මතක නැහැ. අද මේ වන දේවල් වලට පූර්වාදර්ශ වෙලා තියෙන්නේ කියලා, මම තමුන්නාන්සේට මතක් කරනවා. ගෙදර දොර අරින්න බැහැ. දොරට යටින් තුණ්ඩුව දානවා. තුණ්ඩුව දැම්මම වැඩේ කරන්න ඕන. රටේ ඇඳිරිනීතිය. නමුත් නිලනොවන ඇඳිරි නීතිය දැම්මම ගෙදර කන්න බොන්න නැහැ. බබාට කිරි පිටි තිබුණෙ නැහැ. කිසිම දෙයක් වැදගත් නැහැ.

ජේ.ආර් මහත්තයා, ආර්. ප්‍රේමදාස මහතාට රජය දෙනකොට කිව්වේ, මට ලැබුණේ දෙකොන විලක්කුවක් කියලා. උතුරින් යුද්ධය, දකුණෙනුත් යුද්දය. එක්සත් ජාතික පක්ෂයේ හිටපු පිරිස් පක්ෂයක් ලෙස අභියෝගයට අභියෝගයක් වෙලා රට බාරගත්තා. වර්තමානයේ ආණ්ඩුවේ කිසිම මන්ත්‍රීවරයෙක් මේ අභියෝගය භාර ගත්තෙ නැහැ. සියලු දෙනාම එකතුවෙලා, අනෙක් අයත් සමග සියලු දෙනාම ආණ්ඩුවට බනින ස්වරූපයක් තියෙන්නේ. අපි මේ සැරේ ඡන්දයක් ඉල්ලන්නෙ නැහැ. පක්ෂයක් ලෙස නායකයන්ට ශක්තියක් දෙන්න ඕන. ඒ කාලේ මට මතකයි සිරිසේන කුරේ මහත්තයා ප්‍රේමදාස

මහත්තයාගේ මැතිවරණ සටන කරට ගත්තා. සම්පූර්ණයෙන්ම මෙහෙයවූවා. එතුමාට අනගි සහයෝගයක් දුන්නා. කොළඹ නගරාධිපති රත්නසිරි රාජපක්ෂ මහතා ඒ විදිහට කරලා සටන ජයග්‍රහණය කළා. රංජන් විජේරත්නලා ආරක්ෂක ඇමති කරවලා, ප්‍රේමදාස ජනාධිපතිතුමා විප්ලවය කරපු දකුණේ කොල්ලො කෙල්ලො කෝටු වල ඔලු ගහලා, ගංගා වල පාකරලා, වෙඩි තියලා මරලා, කරපු නොකරපු සියලු දෙනාට ඒකෙ පාපය විදින්න වුණ බවත් ඇත්ත. ඒ පාපය විදින්න සිද්ධ වුණා වගේ ජනතා විමුක්ති පෙරමුණට නැවත නැගිටින්න පුළුවන්කම ලැබුනොත්, මං කියපු සිරිසේන කුරේ, සෝමවංශ අමරසිංහ ජනතා විමුක්ති පෙරමුණේ නායකයා අරං ගිහිල්ලා පිටරට ගිහිල්ලා, හංගලා ජීවිතය ආරක්ෂා කළේ නැත්නම්, ඒ විදියට කරන්න වෙන්නේ නැහැ. ජනතා විමුක්ති පෙරමුණ නායකයා දිවි ගලවා ගත්තේ සිරිසේන කුරේ ගෙන් බව මේ අවස්ථාවේ ප්‍රකාශ කරනවා. ඒ නිසා ජනතා විමුක්ති පෙරමුණ අතින් අඩුපාඩු ගොඩක් සිද්ධවෙලා තියෙනවා. අරයගෙ මෙයාගේ වැරදි කිය කියා ගියොත්, යන්න වෙන්නේ රනිල් වික්‍රමසිංහ මහත්මයා කිව්වා වගේ විජය රජ්ජුරුවොන්ගේ කාලෙට. සියළුම රජයන් විසින් වැරදි කරලා තියෙනවා. ඒ වැරදි අද දක්වාම අපි කාගෙ කාගේ අතිනුත් වැරදි සිද්ධවෙලා තියෙනවා. ඒ සම්බන්ධව ස්වයං විවේචනයක් කරලා සියල්ල වැරදි පැත්තට දාලා, රට නිවැරදි තැනකට ගෙනියන්න වැඩපිළිවෙළක් හදන්න ඕන. රාජපක්ෂලාට ගෙදර යන්න කියනවට වඩා ප්‍රශ්නයක් තියෙනවා. ඔවුන් යවලා ඊළඟට මොකක්ද කරන්නේ.  ජනාධිපතිතුමා කියනවා, සජිත් ප්‍රේමදාස මහත්මයා කැමතිනම් 113 පෙන්න ගන්න පුලුවන්නම්, රට භාරගන්න කියලා. නමුත් ගෝඨාභය රාජපක්ෂ මහතා ජනාධිපති වෙලා ඉන්නකම් රට බාරගන්න කැමති නැහැ කියලා සජිත් මහත්තයා කියනවා. අපට අණ්ඩුක්‍රම ව්‍යවස්ථාව පිළිගත යුතුව තියෙනවා. මාර්තු වෙනකම් තමයි ජනාධිපතිට බලය තියෙන්නේ. ඊට කලින් විසුරුවා ගන්නවනම්, පාර්ලිමේන්තුවේ බහුතරයක් දීලා, විසුරුවා ගන්න පුළුවන්.  මේක වන කරන්න හදනවා මිසක්, රට අරගෙන, රට කරන්න යන්නෙ නැහැ. මේ විදියට ආණ්ඩුව ගෙනියන්න බැහැ. ජූලි මාසය වන විට, ඇමරිකන් ඩොලර් බිලියන දෙකක් ගෙවන්න ඕන. 2029 වෙනකන් ගෙවන්න ඕන. ඩොලර් අර්බුදයට විසඳුමක් සොයා ගන්න අවශ්‍යයි. කෙටි, මාධ්‍ය, දීර්ඝකාලීන ඉතාම කැපකිරීම් කරලා දුක්විඳින්නෙ නැතිව කාටවත් මේ රට හදන්න බැහැ. මිත්‍රවරුනි,  මේ කරපු විරෝධතාවයන් සම්බන්ධයෙන් මට කිසිදු කනගාටුවක් නැහැ. කණගාටුවක් විරුද්ධත්වයක්, දුකක් තියෙන්නේ මහින්ද රාජපක්ෂ මහතාගේ කාල්ටන් නිවස වැටලීම හැර, අනෙක් කිසි දෙයක් සම්බන්ධයෙන් දුකක් නැහැ කියන එක මගේ හෘද සාක්ෂියට එකඟව මම ප්‍රකාශ කරනවා. ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගේ ගෙය වැටලුවත්, කුඩු කරත්, මට කමක් නැහැ. නිම කරන්න බැරි අවසන් කර බැරි යුද්ධය අවසන් කරලා, රටේ එහා කොනේ ඉඳලා, මෙහා කොනට ගමන් කර හැකි මාර්ගයක් වාතාවරණයක් හදලා, රටේ අධිවේගී මාර්ග ගොඩනගමින්, රට ගොඩ නගපු නායකයෙක් හැටියට එතුමාගේ ගේ වට නොකොට, වෙන ඕනෙම තැනක්  වටකළාට මට කිසිදු කණගාටුවක් නැහැ කියමින්, සමස්තයක් වශයෙන් ආණ්ඩුවේ වැඩපිළිවෙළ සම්පූර්ණයෙන් වැරදියි. එය නිවැරදි කළ යුතුය. එහෙම බැරි නම් ගෙදර යා යුතුයි. කියන කාරණයත් මේ අවස්ථාවේදී ප්‍රකාශ කරමින්, කරන්න හැකි කණ්ඩායමකට මේ අවස්ථාවේදී රට භාර දෙන ලෙස ඉල්ලා සිටිමින්, බලකරමින්, ජයෙන් ජය වේවා කියා ප්‍රාර්ථනා කරමින්, මගේ අදහස් දැක්වීම අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු මන්ත්‍රී චන්ද්‍ර සහබන්දු මහතා අදහස් දක්වමින්,

ඇප්තොප්වත්තේ කුරුඳු කැල්ලට මොකද වෙලා තියෙන්නෙ. ලක්ෂ හතර පහේ බිල් අනුමත කරල තියනවා. මම ගියා එම ස්ථානය නිරීක්ෂණය සඳහා. කුරුඳු පැළයක් වත් හිටවලා නැහැ. නැවත කැලෑව

වැව්ලා තියෙන්නෙ. වගා කටයුතු සඳහා වියදම් කරපු සල්ලි සභාවෙන් කරන ලද කාබාසිනියාවක් බවයි මට පෙනෙන්නෙ.

ගරු සභාපතිතුමා අදහස් දක්වමින්,

පසුගිය දින වල කුරුඳු පැළ හිගයක් ඇති වුණා. ඒ නිසා ඉදිරියේදී පැළ ලැබුණු විගස පැල සිටවීම කරනවා.

ගරු මන්ත්‍රී චෙරංග ලක්මාල් මහතා පෙ.ව.11.15 ට පමණ සභා ගර්භයට පැමිණෙන ලදී.

ගරු මන්ත්‍රී නිශාන්ත නන්දන මහතා

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සියලු දෙනාගෙන් අවසරයි. අපි රැස්වෙන වෙලාව වන විටත් රටේ සාමාන්‍යකරණයට එහා ගිහිල්ලා, නීති උල්ලංඝනය වන ක්‍රමවේද හදලා දීලා, ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා, ඒ ක්‍රමයකට රට දුවන මට්ටමකට ගෙන ආවා. දාපු හදිසි නීතිය කියන්නේ උපරිම නීතිය. මීට වඩා දාන්න එකක් නැහැ. මේකෙන් ඔප්පු කළේ ගෝඨාභය මහත්තයා බයයි කියන එක තමයි. තව සතියකින් දෙකකින් බලන්න. කාවහරි ඇතුලට දැම්මොත් ඔය කියන නීතිඥවරුන්ටවත් බේරන්න බැහැ. ඒ තරමම බරපතලයි. ඇත්තටම අපට අතිශයම බරපතලයි. අමානුෂිකයි. මොකද මෙම නීතිය තියෙද්දි අත්අඩංගුවට ගත්තොතින්, ජනාධිපති නීතිඥයින්ට දැම්මත්, ඇප ගන්න බැහැ. ගෝඨාභය පත්වෙද්දි මම කිව්වා. ඔබතුමාලා අපි වාද වුණාද වුණා

නමුත් අම්මගේ සොහොනට ලක්ෂ 60, 70 වියදම් කරලා හදද්දි, නම් ඔබ සියලු දෙනා අම්මා තාත්තගේ සොහොන් ඒ ආකාරයෙන් හැදුවොත්, මේ රටට මොකක්ද වෙන්නේ කියලා කල්පනා කරලා බලන්න. මොලයක් තියෙනවනම් ඔය වගේ අයට ඡන්දය දෙන්නෙ නැහැ. කොළඹ ලස්සනට හදලා, මල් ටිකක් වවලා තිබුණම, මාර වැඩ්ඩෙක් කිව්වා. අපිට කතා කරන්න දුන්නේ නැහැ. එක්සත් ජාතික පක්ෂය නැත්තටම නැති කරලා දැම්මා. ජනමාධ්‍යයෙන් මාර සපෝට් එකක් දුන්නා. එයාලට ඒ මාධ්‍යයෙන්ම අද ගහනවා. ඒ මාධ්‍යයෙන්ම තමයි ගෝඨාභය ගේ ඇතුලට හිරකරලා තිබ්බේ. ඒවා දිට්ඨධම්මවේදනීය කර්ම තමයි පල දුන්නේ. පාස්කු ප්‍රහාරය සම්පූර්ණයෙන්ම රනිල් වික්‍රමසිංහ මහතා සහ මෛත්‍රීපාල සිරිසේන මහත්වරුන්ට පෙරලුවාට, එයත් කොනක හරි ඉන්නවා. ඒකයි ඒ අයට මුකුත් කරන්නෙ නැත්තෙ. එහි සම්පූර්ණ සිද්ධියෙන් කොටසක් හරි ගෝඨාභය දන්නවා. ඒ නිසා අවුරුදු තුනක් යනකම් කිසිම කෙනෙක් අත්අඩංගුවට පත් වෙන්නේ නැතිව, මේක ඇතුලෙ වැඩසටහන් හදලා නීතියෙන් කොච්චර බේරුණත්, තමන්ගේ හෘද සාක්ෂියෙන් බේරෙන්න බැහැ. අපිත් මේ මන්ත්‍රීවරුන්ට කියන්නේ, කවුරු මොනවා කිව්වත්, පුද්ගලයන්ව දේශපාලන කෝණයෙන් බලන්න එපා. ගමේ යම්කිසි බඩු භාණ්ඩ බෙදන විට, ඒක දෙන්නෙ කොහොමද? ඒ වගේම සල්ලි අච්චු ගහන කොට මොකද වෙන්නේ කියලා කියන්න ඕන නැහැ.

මිරිහාන වට කරපු එක සම්බන්ධයෙන් කවුරු මොනව කිව්වත් ඒක හොඳයි. දේශපාලන වශයෙන් රට අරාජික වුනොත්, කවුද මේ රට බාර ගන්නෙ? රට අරාජික වෙනවා. හොඳ හරි, නරක හරි, ජනාධිපති අයින් වුනාට පස්සෙ කවුද රට බාර ගන්නේ? මේ ප්‍රශ්න වලට උත්තර සොයන්න බලන්න. තව දින කිහිපයකින් රට අරාජික වෙනවා. පෙළපාලියට යන මිනිස්සු ඒ ගැන දන්නෙත් නැහැ. රනිල් වික්‍රමසිංහ මහතා එක අවස්ථාවකදී ප්‍රකාශ කරනවා. රට නායකත්වයෙන් ගිලිහුණොත්, රටේ නොයෙක් නොයෙක් තැන්වල කල්ලි හදාගෙන ජීවත් වේවි. රටකට හොරෙක් හරි නායකයෙක් සිටිය යුතුයි. හෙට වෙනකොට රට පාලනය කරන්නේ කොහොමද? පඩිනඩි ගෙවන්නෙ කොහොමද? බඩු ගේන්නන්නෙ

කොහොමද? මුදල් ඇමති කවුද? ඩොලර් ගන්නෙ කොහොමද? කවුරු හරි කෙනෙක් මේ අවස්ථාවේ ඇවිල්ලා රට ඔසවන්න උදව් කරන්න ඕන.

ගරු මන්ත්‍රී තරංග සුදර්ශන මහතා

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. අද දවස දිහා බැලුවම, අද 2022 අප්‍රේල් මස 05 වැනිදා. අපට මුලින්ම සිහියට නැගෙන්නේ 2019 අප්‍රේල් 21 වන දා සිදු වූ පාස්කු ප්‍රහාරයත් එක්ක, වර්තමාන රජය බලයට පත් වෙන්න කරපු කුමන්ත්‍රණයක ප්‍රතිඵල, අද මම හිතන්නේ මුළු රටම, සමාජයම බුක්ති විඳිමින් පවතිනවා. මේක ශාපයක් වෙලා. ඊට සහයෝගය දුන් සියලු දෙනාට විඳවන්න වෙනවා. මේ රටේ සියලු දෙනාටත් ඒකෙ ශාපය වැදිලා තමයි මම හිතන්නේ. මෙහෙම 2/3 ආණ්ඩුවකට මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්න වෙලා තියෙන්නේ. අපේ වයසත් එක්ක බැලුවම, මේ රටේ ඉතා අවාසනාවන්තම කාලය තමයි මේ ගෙවමින් යන්නේ. මේ රට කාන්තාවනුත් පාලනය කලා. ඉතිහාසයේ කවදාවත් අද වගේ මේ තනතුරු බාල්දු වුනේ නැහැ. මේ ගෝඨාභය හොඳයි කියලා කියපු සියලුදෙනාම, ඔහුට ගෙදර යන මට්ටමට පාරට බැහැලා, දිවා, රාත්‍රී උද්ඝෝෂණය කරන තත්වයට රට පත් වෙලා. දිස්ත්‍රික්ක 25 පුරාවටම ව්‍යාප්ත වෙලා තියෙනවා. අපි ගිය සභාවේ ඔබතුමා කතා කරන විට නැගිටලා ගියා. එහෙම කළේ මොකද, අපි හැම සභාවකදී ම කතා කරන දේවල් වලට උත්තරයක් දෙන්නෙ නැතිව, අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මහතා, මහින්ද රාජපක්ෂ මහත්තයලගෙ වැඩපිළිවෙළ ඉදිරියට ගෙන යනවා. ඒ පම්පෝරි ගැහුවට, ඔබතුමාලා එම වැරදි නිවැරැදි කරන්න උත්සාහ දැරුවේ නැහැ. ඇත්තටම අපේ හිටපු සභාපති, අජිත් මහත්තයාගේ කතාවේදී ඒක කියැවුණා. සියලු දෙනා හිටියේ මේක කවදාවත් වෙනස් වෙන්නේ නෑ කියලා හිතාගෙන. ඇත්තටම අපි කිව්වා. සභාපතිතුමනි, ඔබට මේක කරන්න බැරිනම්, සම්බන්ධීකරණ කමිටුවකදී හරි දිස්ත්‍රික් කමිටුවකදී හරි නායකයින්ට මේවා කියන්න කියලා. ඔබතුමාලා ඒවා තඹ සතයකට මායිම් නොකරපු නිසා, ඔබතුමන්ට ඡන්දෙ දීපු ඡන්දදායකයෝ අද ඔබතුමාට විරුද්ධව කටයුතු කරන්න අරගෙන තියෙනවා. උඩුගම තිබුණු උද්ඝෝෂණයකට සහභාගි වුණේ, ජනතා විමුක්ති පෙරමුණේ අයවත්, එක්සත් ජාතික පක්ෂයේ අය වත් නෙවෙයි. ඔබතුමාලට ඡන්දය පාවිච්චි කරපු අයම තමයි. ඔය උඩුගම මන්ත්‍රීවරු බලන්න. ඒ ෆොටෝ අරගෙන කවුද මේවට සහභාගි වෙලා තියෙන්නෙ කියලා.

විශේෂයෙන්ම කියන්න ඕන. සභාපතිතුමනි, මේ වර්තමාන අර්බුදයට වගකිව යුත්තේ කවුද කියලා අජිත් මහත්තයාගේ කතාවේදී ඉතා හොඳින් එම කරුණු සම්බන්ධව විග්‍රහ කළා. නමුත් එතුමගේ මතයට 99% ක්ම එකඟයි. එතුමාගේ සියලු කාරණාවලින්, එතුමා ඉදිරිපත් කළේ, ගෝඨාභය මහත්තයාගේ ගෙදරට ගැහුවට කමක් නැහැ. නමුත් එතුමා එකඟ නොවෙච්ච කාරණයකට අපි එකඟ වෙනවා. මොකද මේ කොහේවත්, ඇමරිකාවේ හිටපු අය ලංකාවට ගෙනාවේ කවුද? එතුමගේ සහෝදරකමට, බලයට මහින්ද රාජපක්ෂ මැතිතුමා, එතුමගේ බලය නිසා ඇරෙන්න ඇමරිකාවේ පදිංචි කාරයෝ මෙහෙට එන්නෙ නැහැ. ලංකාවේ පියන්කමක්වත් ගන්න සුදුසු අය නෙවෙයි. මේ අය රැකියා දාලා, තනතුරු කරන්න බැහැ කියලා, රටින් ගිහිපු අය, බැසිල් ගෙනාවෙ, ඒ අයටත් මුදල් ඇමැතිකම් දීලා, පාර්ලිමේන්තුවේ ඉහළම තනතුරු දුන්නේ. ඒ සම්බන්ධව සියලුදෙනා වගකිව යුතුයි. මහින්ද මහත්තයට තුන්වැනි වරටත් ජනාධිපති ඡන්දය ඉල්ලන්න බැරි වෙනකොට, ගෝඨාභය මහත්තය ගෙනැල්ලා, සමහරවිට එතුමගේ පුතාව හරි ඉදිරියේදී පත් කරන්න හිතාගෙන වෙන්න ඇති. බලය පිටට යන්න නොදී, එම අවස්ථාව උදාකර දුන්නේ. පසුගිය ජනාධිපතිවරණයේදී අපිත් සජිත් ප්‍රේමදාස මහත්තයාට වැඩ කළා. ඉතින් එවිට අපිත් කණ්ඩායමක් ලෙස එතුමාට සහයෝගය ලබා දුන්නා. නමුත් සජිත් මහතා පැරදුනාට අපි සතුටු වුණා. ගෝඨාභය රාජපක්ෂ මහත්තයාට යමක් කරන්න හැකියාවක් තියෙන දක්ෂ මනුස්සයෙක් කියලා. නමුත් එතුමා දැන් ඔප්පු කරල ඉවරයි. කිසිම දෙයක් කරගන්න බැරි කෙනෙක්

හැටියට. සමහරු කිව්වා. සරත් ෆොන්සේකා මහත්තයා නොහිටින්න, ප්‍රභාකරන් මැරෙන්නෙත් කොරෝනා හැදිලයි කියලා. ඉතාම කෙටි කාලයක් තුළ රට විනාශ කරලා ඉවරයි. මේ ප්‍රශ්නය අද ඊයේ ආපුවා නොවෙයි. මේ පාර්ලිමේන්තුවෙ හිටිය සමහර නායකයෝ මේ ප්‍රශ්නය දැක්කා. විශේෂයෙන් රනිල් වික්‍රමසිංහ මහතා මේක මාස ගණනකට කලින් කිව්වා. සංචිත අඩු වෙලා, ඒවා වැඩි කරගන්න, විකල්ප ගේන්න ඕන බව කියපු, දුර දක්නා නායකයො හිටියා. ඒවා කිසි දෙයක් තුට්ටුවකට මායිම් නොකරපු මුදල් ඇමතිවරයෙක්, ජනාධිපතිතුමා, අගමැතිතුමා ඒ සියලුම දෙනා එකතු වෙලා තමයි මේ කටයුතු කලේ. ඔබතුමා ඇතුළු මේ **15** දෙනා ඇත්තෙන්ම මේකට වගකිව යුතුයි. මොකද මේ ජනාධිපතිතුමාට මේක දාලා යන්න කිව්වට, ව්‍යවස්ථානුකූලව බැරුව ඇති. නමුත් පවුලට හා බලයට තියෙන ආශාව නිසා එතුමා මේක දාලා යන්නෙත් නැහැ. ඔහුට අවස්ථාව දුන් අයට, නැවත අවස්ථාව දීලා යන්න ඕන නිසා, ජනාධිපතිතුමා, අගමැතිතුමා ඉල්ලා අස් නොවී, ඇමති මණ්ඩලය මාරු කරනවා. නමුත් රටේ මහජනතාව මෝඩයට අන්දලා, ඇමතිවරු එහාට මෙහාට කරනවා. අපගේ දිස්ත්‍රික්කයේ ආසන සංවිධායක සම්පත් මහත්තයාගේ ගෙදරත් වටලලා, දැනුත් මේ මිනිස්සු මේ සභාව ඉදිරියට ඇවිල්ලා, උද්ඝෝෂණ කරන්නේ, ඔබතුමාලා මේවට වගකිව යුතු බව දන්වන්න. ඉතිහාසයේ අපි දැකලා නැහැ. මේ වගේ ප්‍රාදේශීය සභා වට කරනවා. එහෙම වෙලා තියෙන්නේ ප්‍රාදේශීය සභා, පළාත් සභා ආසන සංවිධායකවරයා දක්වා, උඩින් කියන දේ හරි කියලා හිතාගෙන. නියම ප්‍රශ්නය වසං කරපු නිසා අදත් ඔබතුමාලා කරන්නේ ඒකයි. ගමේ අයට බීජ වර්ග, පැළ වර්ග බෙදනවා. අදටත් කරන්නේ ඒ වංචාව. list ලිස්ට් එක හදනවා. ඒවා කපනවා. එහෙම කරන්න එපා. මිනිස්සුන්ට අද ජීවත් වෙන්න බැහැ. හාල් කිලෝ එක රුපියල් 200යි. ඔයිල් ලීටරය රු.680 ට ගත්ත එක දැන් රුපියල් **1000.00**යි **320.00** ක් වැඩිවෙලා. මම හිතන්නේ රටේ ජනාධිපතිවරයාගේ සිට පහළම මට්ටමේ අපි දක්වා, මේ දේවල් වලට මුහුණ දෙන්න සිදුවෙලා තියෙනවා. ඇත්තටම අද මේ මහජනතාව පාරට බැහැල තියෙන්නෙ. ඔවුන්ගේ ඉල්ලීම් වලට කන් දෙන්න. ඉල්ලීම් ඉටු කරන්න, උත්සාහ ගන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ වගේම අද වන විට ඔබතුමන්ලාගේ වැඩිහිටි දීමනාව කපා හැරලා තියෙනවා. ඒවා දෙන්න ඕන දුප්පත් අහිංසක මිනිස්සුන්ගෙ දීමනාව. ඒ වගේම සමෘද්ධි ලේඛන වෙනස් කරලා තියෙනවා. සාධාරණව දෙන්න ඕන. මිනිස්සු ග්‍රාම නිලධාරීගෙන් ඇහුවම, දන්නේ නැහැ ගමේ ඉන්න මන්ත්‍රී තමයි ඒව හදන්නේ. ලිස්ට් එක ප්‍රාදේශීය ලේකම් වරයාගේ නමුත් ඔබතුමන්ලා ප්‍රයෝජනයට ගන්නෙ මම හිතන්නේ ඒවායේ ප්‍රතිඵල විදියට තමයි. දැන් මේ මිනිස්සු උද්ඝෝෂණය කරන්නේ. තව ටික දවසකින් විපක්ෂයේ අපේ මන්ත්‍රීවරුන්ගෙත් ගෙවලුත් වට කරන්න එයි. අවසාන වශයෙන් නිවැරැදිව කටයුතු කරන්න කියලා ඉල්ලමින්, මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු මන්ත්‍රිනී ගයන්ති කුමාරි මහත්මිය

සියලු දෙනාගෙන් අවසරයි. අපි මීට පෙරත් පාරට බැහැලා, මෙම අනාවැකිය පෙන්වලා දුන්නා. නමුත් සතපහකට ගණන් නොගෙන විහිළුවකට ලක් කළා. ඒවායේ ප්‍රතිඵල අද වන විට හොඳටම පෙන්නුම් කරලා තියෙනවා. සුභාෂි මන්ත්‍රීතුමිය එළියෙ ඉන්නේ නරි නෙවෙයි. ඒ මහජනතාව ඔවුන්ගේ දුක්ගැනවිලි ඒ කියන්නේ. අපි ඉන්නේ මහජනතාව නියෝජනය කරමින්. ඇත්තටම මම කනගාටු වෙනවා. ඔබතුමියගේ ගේ වට කරලා, ඔබතුමියට අනතුරක් වෙනවට මේ කිසිම කෙනෙක් කැමති නැහැ. අපේ ජනතාව කුපිත වෙලා ඉන්නේ. අපිත් ජනතාව බොහොම අමාරුවෙන් පාලනය කරගෙන ඉන්නෙ. අපටත් පුළුවන් ජනතාව කුපිත කරවන්න. මම ඔබතුමියගෙන් ඉතා කාරුණිකව ඉල්ලා

සිටිනවා. මේ ජනතාව තවත් කුපිත කරලා, මේ රට තව තවත් අර්බුදයකට ගෙනියන්න එපා කියලා, මේ රටේ තත්ත්වය පිළිබඳව අවබෝධ කරගනිමින්, මන්ත්‍රීවරුන් කටයුතු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

අපේ තරංග මන්ත්‍රීතුමාත් මතක් කළා. වැඩිහිටි දීමනාව සම්බන්ධව. මේ වන විට මිනිස්සුන්ට බොහෝ ප්‍රශ්න තියෙන වෙලාවේ, සමෘද්ධි දීමනාව හා වැඩිහිටි දීමනාව කපා හැරීම සම්බන්ධව කණගාටු වෙනවා. ඇත්තටම අපි ඔබතුමාගෙන් ඉල්ලනවා. ඒක නිවැරදි කරන්න කියලා. නැත්නම් දුප්පත් අහිංසක මිනිස්සුන්ට බොහොම අසාධාරණයක් සිද්ධ වෙන්නේ. මේ කාලයේ වැඩි වැඩියෙන් මිනිස්සුන්ට ආධාර අවශ්‍ය කාලයක්. ඒ වගේම සභාපතිතුමා, ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ පහුගිය දවස් වල සාකච්ඡාවක් පැවැත්වුණා. මමත් සහභාගි වුනා. කාන්තා හා ළමා ආරක්ෂණ වැඩසටහනක්. එම නිලධාරීන්ගේ අදහස වුණේ, ප්‍රාදේශීය සභා මට්ටමින්, කාන්තා ආරක්ෂණ වැඩපිළිවෙළක් මහජන නියෝජිතවරියන් සම්බන්ධ කර ගනිමින් ක්‍රියාත්මක කිරීමට. ඒ සඳහා ලිපි සභාවට එවලා ඇති බව සඳහන් කළා. ඒ නිසා කාන්තාවන් වෙනුවෙන් ලැබුණු හොඳම අවස්ථාව මේක. ආරක්ෂක කමිටුව පිහිටවන්න කියලා මම මේ වෙලාවේ යෝජනාවක් හැටියට කරමින්, මම නිහඬ වෙනවා

ගරු මන්ත්‍රී වසන්ත කුමාරගේ මහතා

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. මම මේ වෙලාවේ කතා කරන්න නොහිටියත්, කතා නොකළොත් ඒක මගේ හිතටත් හරි නැති වගෙයි. ඒ වගේම මේ සියලු කතන්දර වල අනාවැකිය තමයි. මම කිව්වා. ගෝඨාභය රාජපක්ෂ මහත්තයා දිවුරුම් දෙන දවසේ, මේ සිදුවන සියලු සිදුවීම් සම්බන්ධව, මම ඔබතුමන්ලා දැනුවත් කරල ඇති. ඒක බොරුවක් නෙවෙයි. අද වන විට පසක් වෙලා තිබෙනවා. සභාපතිතුමනි, මම දේශපාලනය කළේ පොඩි එකා කාලේ ඉඳලා. දැනට අවුරුදු 30 කට උඩදී. අපි දන්නවා ගොනා හැරෙනකොට පොල් පැලේ කන්න කියලා. දන්න නිසා තමයි මම කිව්වේ. මුල ඉඳලම තමුන්නාන්සේලා මට හිනා වුනා. සෞභාග්‍යයේ දැක්ම නෙවෙයි අභාග්‍යයේ දැක්ම කියද්දිත් මට හිනා වුණා. මොකද මට තේරුණා මේ මනුස්සයට මේක ගෙනියන්න බැහැ. හමුදාවේ ප්‍රධානියා වුණාට, රටක් පාලනය කරන්න බැහැ කියලා. නමුත් අපි කණගාටු වෙනවා. මොකද රටක් හැටියට, අපේ දරුවන්ගේ රට අද විනාශ වෙලා. ඇත්තටම මට අද අපේ රට ගැන පුදුම වේදනාවක් තියෙන්නෙ. මම දැක්කා කලාකරුවෝ පිරිසක් කියනවා. මේක අපේ රට. අපි මේක දාලා යන්නේ නැහැ කියලා. අපි ඉපදුනෙත් මේ රටේ. මැරෙන්නෙත් මේ රටේ. සමහරුන්ටනම් ගානක් නැහැ. පිටරටවල් වල පුරවැසි භාවයක් තියෙනවා. ඒ නිසා රට ගැන කැක්කුමක් නැහැ. මම ඔය කපුටාස් උන්නැහේ ලංකාවට එනකොටම කිව්වා. ඔය එන්නේ මේ රට කන්න කියලා. 2015 කාලා පැනපු විත්තියත්, එයාගේ නඩු ටික නිදහස් වෙන්න තමයි එන්නේ කියලා. හදවතේ තියෙන සියල්ල ඇහිරෙනවා. මේක කතා කරලා, අපේ මන්ත්‍රීවරු කිව්වා වගේ, දරුණුම පාලනයක් එන්නේ. අපේ මහජනතාව ඉවසලා ඇති වෙලා තමයි මේ පාරට බැහැල තියෙන්නෙ. සමගි ජන බලවේගය නෙවෙයි කාටවත් මේ රට පාලනය කරගන්න බැරි වෙනවා. දේශපාලනය දරුණුතම අවස්ථාවකට මුහුණ දෙන්න වෙලා තියෙන්නේ. මොන දේශපාලන පක්ෂය ආවත්, ඔය අත්දැකීමෙන් ඔය වැඩේ කරනවා. පොහොර ටික දුන්න නම්, මේ තත්වය යම්තාක් දුරකට පවා පාලනය වෙනවා. දුරදිග නොබල ගත්ත අමනෝඥ ක්‍රියාවක් නිසා තමයි මේ සියල්ල සිදුවෙලා තියෙන්නේ. තවම මේ කට්ටිය කුරුඳු පැල, කුකුල් පැටව් බෙදනවා. මේවද කරන්න ඕන. මේවා මිනිස්සු ඉල්ලනවද? වසමකට ලක්ෂ ගණන් වලින් සල්ලි දැම්මා. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුව කාලේ මුදල් කළමනාකරණය කරගෙන, වසමකට ඉතා සුළු මුදලක් යොමුකරේ. දැන් අතිවිශාල මුදලක් යොදවලා, පාරවල් කපන්න අති විශාල ධනස්කන්ධයක් විසි කරනවා. මේක තමයි මේ රටට වැදුණු හෙණේ. නැත්නම් තමුන්නාන්සේට අවුරුදු හතරක් නෙවෙයි. අවුරුදු දහයක්, පහලවක් රට

ගෙනියන්න තිබුණා. මේ වැරදි පරිපාලන ක්‍රමය නිසා තමයි. මේ රටට මෙහෙම වෙලා තියෙන්නෙ. කෑම, තෙල්, විදුලිය, ගෑස් සියල්ල ඉල්ලලා, පාරට බහිනවා. පෝලිං තියෙනවා. ඒ වගේ තත්ත්වයකට රට පත්වෙලා ඉවරයි. මොන නායකයා ආවත්, රට ගොඩනගන්න බැරි තත්ත්වයක් තියෙන්නේ. මේ ආණ්ඩුවෙ ජනාධිපතිවරයා ඉල්ලා අස් වෙන්න ඕන. මේ රාජපක්ෂ ආණ්ඩුව තියෙනකම්, කිසිම රටකින් මුදල් ආධාරයක් ලැබෙන්නේ නැහැ. අද ඒකෙ ප්‍රතිඵල ලැබිලා තියෙනවා. හැබැයි විපක්ෂනායකතුමනි, මේ සිද්ධාන්තයට අපිත් වගකියන්න ඕන. මේ පොහොට්ටුවට **2/3** බලයක් ආවේ, අපි බෙදිලා හිටිය නිසා. ඒ නිසා තමයි මේගොල්ලෝ තමන්ගේ ඒකාධිපති ස්වරූපයෙන්, තමන්ගේ දේශපාලන න්‍යාය පත්‍රය ක්‍රියාත්මක කරගෙන යන්නේ. මිනිස්සු පාරට බැහැලා, ඉල්ලීම් ඉල්ලනවා. හැම දේශපාලන පක්ෂයකටම බනිනවා. ළමුන්ගේ පාසල් අධ්‍යාපනය ඉවරයි. ලබන අවුරුද්දෙ වෙනකොට පෙළපොත් ටිකවත් දෙන්න බැහැ. හැබැයි ඉදිරියේදී පාර්ලිමේන්තුව විසුරුවලා, කැමති කෙනෙකුට රජයට එන්න පුළුවන් වන පරිදි මැතිවරණයක් කරා යන්න පුළුවන් විදිහට රට හදලා දෙන්න ඕන. මේ ආණ්ඩුව, ජනාධිපතිවරයා වහා ඉල්ලා අස්වෙන්න ඕන. ජනාධිපති, ජනවරමින් ගන්න ඕන. එහෙම වුනොත් තමයි යුරෝපා ආදී රටවල් අපේ රටට ආධාර උපකාර කරන්නේ. මම එදා කිව්වා. රාජපක්ෂ ආණ්ඩුව තියෙනකම් කිසිදු රටකින් ආධාර උපකාරයක් ගන්න වෙන්නේ නැහැ කියලා. අද එකේ ප්‍රතිඵල ලංකාවේ ජනතාවට අත්විඳින්නට සිදු වෙලා තියෙනවා. මේකට එක්සත් ජාතික පක්ෂයත් වගකියන්න ඕන.

මේ වෙලාවේ පැහැදිලිවම ලෝකෙ පිළිගන්න නායකයෙක් බිහිවෙන්න ඕන. ඒවගේම මේ දූෂකයෝ, මැතිවරණය තුළින් පාර්ලිමේන්තුවට නොයැවිය යුතු යි. එයට විරුද්ධව ජනතාව පෙළ ගැහෙනවා. දූෂණයෙන් තොර අය තමයි බලයට එන්න ඕන. ජනතා පාරට බැහැලා කියන්නේ, හොර බොරු නැති අය තමයි පාර්ලිමේන්තුවෙ ඉන්න ඕන. විශේෂයෙන් තව එකක් කියන්න ඕන. අනාගතයේ බිහිවන නායකයා නූතන දුටුගැමුණු කෙනෙක්, නූතන ධර්මාශෝක කෙනෙක් වෙන්න පුළුවන්. ඔහු දීර්ඝ කාලීනව රට පවත්වාගෙන යනවා. මෙතන සිටින මන්ත්‍රීවරු මගදි හම්බ වුනොත් මට කියන්න. ඒක ඇත්ත වෙනවා. හැබැයි මේ වගේ කිසිදු දේශපාලනඥයකුට වංචාවකට, දූෂණයකට අත තියන්න ලැබෙන්නේ නැහැ. එහෙම වුනොත් ජනතාව උත්තර දෙනවා. වංචාව දූෂණය නැති කරන්න. මේ රට කන්න එපා. උඹලා ළඟ තියෙන ඒවත් දෙන්න. එහෙම දෙන්නෙ නැතුව රටින් යන්න දෙන්නෙත් නැහැ.එවැනි දෝෂාරෝපන එනවා.

ඒ වගේම මත්තල ගුවන් තොටුපළට අර ඉතියෝපියාවෙ තියෙන මහින්ද රාජපක්ෂලාගේ ජෙට් එක ගෙන ඇවිල්ලා පුරවලා එකක් ගෙනිච්චෙ ඩොලර්. ඒක තමයි ඇත්ත කතාව. ජනතාව අද කියනවා මහ රෑ ඇවිල්ලා, ලංකාවේ මහ බැංකුවේ තිබ්බ්ච ඩොලර් ටික අරං ගියා කියලා. ඒක තමයි ඩොලර් හිගයට මුල. කරපු අපරාදෙට, මේ රාජපක්ෂලාට හෙන ගහනවා. මිනිස්සු දුක් විඳිද්දී, තෙල් නැව් ඇවිල්ලා ආපහු යනවා. ගෙවන්න ඩොලර් නැති නිසා, නමුත් කොමිස් ගෙවනවා. මීට හේතුව තමයි හොරාකාපු එක. අද ඊයේ හොරා කැවේ නැහැ. **2015** හොරා කෑවා. උන් පිටරට ගිහින් ඉදීවි. මේ පහලොස් දෙනාට තමයි ගමේ ජනතාවට උත්තර දෙන්න වෙන්නේ. තමුන්නාන්සේලා තමයි පහුගිය මැතිවරණයේදී මිනිස්සුන්ට බෝලෙ පාස් කරලා ගෙයින් ගෙට ගිහිල්ලා, ඡන්දය අරන් දුන්නේ. ගරු මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, දැන් තමුන්නාන්සේලාටත් තියෙන්නෙ, දැන් රාජපක්ෂලා ඕන නැහැ. නම්බු පිටින් ඔය ගෙරි හම ගලවලා, තමන්ගේ පාඩුවේ වැඩක් කරන් ඉන්න. තමුන්නාන්සේලා ගැනත් ගමේ මතවාදයක් යනවා. වැඩි දවසක් නොගිහිල්ලා තමුන්නාන්සේලාටත් විරෝධය එයි. මේ තත්වයෙන් රට ගලවා ගන්න යහපත් නායකයෙකු බිහි වේවායි පතමින්, මම නිහඬ වෙනවා.

ගරු මන්ත්‍රිනි නෙලී වක්වැල්ල මහත්මිය

ගරු සභාපතිතුමා ඇතුළු සමස්ත සභාවෙන් අවසරයි. වර්තමානයේ අපේ රටේ ඇති වී තිබෙන තත්වය ගැන අමුතුවෙන් කතා කරන්න අවශ්‍ය නැහැ. මොකද දැන් ගොඩක් පිරිස ඒ ගැන කතා කළා. දැන් අපේ රටේ ජනතාව ඉතා අසීරු තත්වයක ඉන්නෙ. බඩු මිළ වැඩිවෙලා. හැම පැත්තෙන්ම පෝලිම් බිහි වෙලා. බලන්න දූප්පත් මිනිස්සු ගෑස් ගන්න පෝලිම්වල එනවා. නමුත් ඔවුන්ට ගෑස් ගන්න වෙන්නෙ නැහැ. මොකද ව්‍යාපාරිකයො ගෑස් එකතු කරනවා.

ඒවගේම මේ රජය මගින් පහුගිය දවස්වල කුරුඳු පැළ, කුකුල් පැටව් බෙදා දීමේදී සහ නිවාස සකස් කර දීමේදී ඒ සියළු වරප්‍රසාද එකම පවුලට තමයි හිමිවෙන්නෙ. මේ හේතුව නිසා ගම්වල පිරිහීම් සිදු වනවා. ගරු සභාපතිතුමනි, මේ සම්බන්ධයෙන් සොයා බලන්න ඔබතුමාට බලය තියෙනවා. මීට වඩා කතා කරන්න බලාපොරොත්තුවෙන්නේ නැහැ. බොහොම ස්තූතියි.

ගරු මන්ත්‍රී සමන් නාපෙ විතානගේ මහතා

ගරු සභාපතිතුමා ඇතුළු සියලුම මන්ත්‍රී මන්ඩලයෙන් අවසරයි. රජයක් හැටියට රජය විදියට ගන්න ඕන තීන්දු අරගනිමින් පවතිනවා. නමුත් ඔබ අප සියලු දෙනාම අපහසුතාවයට හා අසරණභාවයට පත් වෙච්ච අවස්ථාවක්. මිනිස්සු විදිහට පාරට බැහැලා, උද්ඝෝෂණය කරන එකේ සාධාරණත්වයක් තියෙනවා. නමුත් මේ වෙලාවේ කතා කරන්න ඕන. දේශපාලන පක්ෂ නියෝජනය කරන මිනිස්සු විදිහට, මම හිතන්නේ, මම මේ වෙලාවේ ස්තූතියක් කරන්න කැමතියි. අද සභාවේ ලස්සන කතා ටිකක් ඇහුවා. අපේ සහබන්දු හිටපු සභාපතිතුමා පුදුම ලස්සන කතාවක් කළා. ඒ වගේම නන්දන මන්ත්‍රීතුමා හොඳ කතාවක් කළා. මම හිතන්නේ අපි ගරු කරන්න ඕන නායකයො ඉන්නවා. රටේ මම මේ වෙලාවේ දකින එකම නායකයා විපක්ෂයක් විදිහට රනිල් වික්‍රමසිංහ මහතා ඇත්තටම හොඳ නායකයෙක්. හොඳ නායකයෙක් කියන්නෙ මිනිස්සු කුපිත කරන්නෙ නැතුව, ආණ්ඩුවේ වැරැද්ද විතරක් පෙන්වා දීලා, මිනිස්සු පාරට බස්සලා, පීඩාකාරී තත්ත්වය තව අවුල් කරන්න උත්සාහ කරන්නේ නැහැ. ඇත්තටම මේ වෙලාවේ පීඩාවට පත්වූ ජනතාව උද්ඝෝෂණය කරන්න ඕන. නමුත් ගම නියෝජනය කරන නායකයා විදිහට, මෙම උද්ඝෝෂණ වලට උදව් කරනවා නම්, ඒක පහත් ක්‍රියාවක්. මේ ක්‍රියාදාමය තුලදී මිනිස්සු විදිහට කාගේ අතිනුත් අඩුපාඩු වෙන්න පුළුවන්. නමුත් රජයක් වශයෙන් එසේ කිරීමට බලාපොරොත්තු වෙන්නේ නැහැ. අපි බලාපොරොත්තු වෙනවා රජයක් විදිහට, මේ රට අරගෙන මේ රට පාලනය කරනවා නම්, අපි ඒකට එකඟයි. එම නිසා ඔබ ප්‍රාර්ථනා කරන හොඳ රජයක් මහින්ද රාජපක්ෂ මහතාට කරන්න හැකියාව ලැබේවායි ප්‍රාර්ථනා කරනවා. එහෙම නැත්නම් වෙනත් රජයකින් හරි මේ රට ගොඩ අරගෙන කරන්න පුළුවන් වේවායි ප්‍රාර්ථනා කරනවා. අපි ගම් නියෝජනය කරන මන්ත්‍රීවරු විදිහට, මම මේ වෙලාවේ රනිල් වික්‍රමසිංහ මහතා නියෝජනය කරන, ඒ සියලු දෙනාටමත් ගෞරවය පුද කරනවා. පෙලඹවීම් වලට උදව් නොකර කටයුතු කරනවා. පෙළඹවීම්වලට ලක්කරන අනිත් සියලු දෙනා කෙරෙහි කණගාටු වෙමින්, මගේ කතාව අවසන් කරනවා. බොහොම ස්තූතියි.

ගරු මන්ත්‍රී ලක්රුවන් සම්පත් මහතා

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ වෙලාවේ රට අර්බුද තත්ත්වයකට පත් වෙච්ච අවස්ථාවකදී, මේ රටේ ඉතිහාසයෙ හැමදාම අපේ ආර්ථිකය, පිටරටියන් මත යැපෙන තත්වෙකට පත් කරලා, භාණ්ඩ ආනයනය කරලා, ආනයන ආර්ථිකයට හැඩ ගැහිච්ච නිසා තමයි, අද අපි මේ තත්ත්වයට පත් වෙලා තියෙන්නේ. හැමදාම මම කියන එකක් තමයි. අපේ රටේ දේශීය නිෂ්පාදන, දේශීය කර්මාන්ත නොමැති වීම තමයි, අද රටේ අර්බුදකාරී තත්ත්වයකට පත් වීමට මූලික හේතුව වෙලා තියෙන්නෙ. උග්‍ර

ලෙස රටට බලපාලා තියෙන්නේ ආහාර අර්බුදය. අපේ රජය උනත්, යම් යම් තීන්දු ගැනීමේදී, එහි ප්‍රතිඵල අනිසි විදිහට දකිනවා. අපේ බුදුරජාණන් වහන්සේ අසමසම පුද්ගලයෙක් වුවත්, බුද්ධත්වයට පත්වෙද්දි, සෑම දෙනාගේම ඇහුම්කම්දීමට තරම් කාරුණිකභාවය තිබුණා. මම හිතන්නේ අපේ රටේ සියලුම නායකයන්ට හොඳ ආදර්ශයක් මේ කාලවකවානුව. මොකද දේශපාලන වශයෙන් සහබන්දු මහත්තයා කිව්වා වගේ 2/3 ආණ්ඩුවක්, රජය පවත්වාගන්න රටේ ජනතාව උපරිමයෙන්, ඉතාම කැපකිරීමකින්, දෙස් විදෙස් අය පවා ඡන්දය පාවිච්චි කරන්න මෙහේට ආවා. එනිසා එම කාලවකවානුව තුල රටේ යම් අර්බුදකාරී තත්ත්වයක් නොතිබුනා නෙවෙයි. නමුත් යම් යම් ප්‍රශ්න නිසා මේ තත්වයට පත් වෙන්න සිදු වුණා. මොකද ටීවී දාලා, පත්තර කියවන්න ගියහම, පත්තරේ තියෙන එක නෙවෙයි එතන වාඩි වෙලා ඉන්න පුද්ගලයා තමන්ගේ අදහස තමයි ගම්‍ය කරන්න උත්සාහ ගන්නෙ. අපේ හිටපු සභාපති අජිත් එඩේර ආරච්චි මහතා ප්‍රකාශ කලා වගේ, මම එකඟ වෙනවා වගේම, මම හිතන්නේ හැම රජයක්ම වගේම නියෝජනය කරන්න, හැම රජයක්ම හදන්න මහන්සි වෙන, බැනුම් අහන 27 දෙනෙක් වශයෙන් අද අපි මෙතන වාඩි වෙලා ඉන්නවා. ඒ නිසාම එකේ ලොකු බරපතල කමක් තියෙනවා. දිගින් දිගටම මෙහෙම වුනොත්, අපි කාටවත්ම දේශපාලනයක් කරන්න මේ රටේ අවකාශයක් ඉතිරි වෙන්නේ නැහැ. අපි සියලු දෙනා මේ වෙලාවේ එකතු වෙලා, ගම්මට්ටමින් සභාවේ යම් කටයුතු වලට මුහුණ දීලා, ඒ කටයුතු කළා. ඒ වගේම මේ රටේ තියෙන උද්දච්චකම් ආදී සියලු දේවල් අත හැරලා, මේ පාර්ලිමේන්තුවෙ ඉන්න ජේෂ්ඨතමයන්ගේ අදහස් ලබාගෙන, මේ රට ඉදිරියට ගෙනියන්න කටයුතු නොකළොත්, අපට නැවතත් යටත්විජිතයක් බවට පත්වීමේ ඉඩකඩ වැඩි බව තමයි මගේ විශ්වාසය. මේ බලවේගයන් එක්ක විදේශ රටකින් ආක්‍රමණයක් එන්න ඉඩකඩ වැඩියි. දැන් තියෙන්නේ පොහොසත් රටකින් ආධාරයක් අරගෙන මිසක්, වගා කරලා, ආදායමක් අරගෙන යම් දෙයක් කරන්නත් බැහැ. අපට මුදල් ඇත්තෙත් නැහැ. විදේශ මුදල් සොයාගැනීමට තියෙන එකම දේ තමයි, කාට හරි කොන්දේසි වලට යටත් වෙලා, මේ කටයුතු කරන්න වෙන්නේ. මීට වඩා කැප කිරීමක් කරන්න අවශ්‍ය වෙනවා. කවුරු ආණ්ඩුව කලත්, රජයේ ඉහළ නිලධාරීන් මේවට වගකිව යුතු වෙනවා. ගමේ සාමාන්‍ය ජනතාවට ඒ දේවල් කරන්න බැරිවීම නිසා තමයි නිලධාරීන් පත් කරලා ඉන්නෙ. ඒ අයගෙ රාජකාරිය කළා ද කියන එකත් මේ වෙලාවේ ගැටලුවක් වෙනවා. පාලනය කරන පාලකයින්ට පවත්නා දියුණු රටවල ක්‍රමවේද භාවිතයට ගන්නවා නම්, මෙහෙම වෙන්න විදිහක් නැහැ. ඔවුන්ගේ වගකීම දැනුම යාවත්කාලීන කරලා හරි ඒ දේවල් හරියට කලානම්.

වෘත්තිය සමිති සියල්ල පාලනය හා ක්‍රියාත්මක කරන්නෙ, වෘත්තීය සමිති මේවා වෙනස් කරනකම්, කවුරු පාලනය ගෙන ගියත්, එය නිවැරදිව කරන්න බැහැ. එන එන ආණ්ඩු එන එන දේවල් කරන්න ගිහින් තමයි රට මේ තත්වයට පත්වෙලා තියෙන්නෙ. ඉතා පැහැදිලි දර්ශනයක්, ප්‍රතිපත්තියක් මේ දේශපාලන මතිමතාන්තර කෝන්තර අමතක කර දාලා, ගමනක් ගියොත්, යන්න පුළුවන් නන්දන මන්ත්‍රීතුමා සඳහන් කළා වගේ, ලොකු ලේ වැගිරීමකට යන්න පුළුවන්කම තියෙනවා. මේ දේශපාලන මතිමතාන්තරවලට ආණ්ඩු පක්ෂයේ සිටින සියලු දෙනාම මේවට කඩිනමින් පිළියම් හොයන්න ඕන. වනමල් මන්ත්‍රීතුමාගේ කතාවේදී එක වැදගත් දෙයක් කතාවු.ණා මමත් අනුමත කරනවා. එතුමන්ලගේ පක්ෂයේ වැරදි තීන්දුවක් නිසා තමයි මෙවැනි ආණ්ඩුවක් පත් වුණේ කියලා. එදා වැරදි තීන්දුවක් නොගත්ත නම් මෙවැනි තත්ත්වයකට මුහුණ දෙන්න වෙන්නෙ නැහැ. සැවොම එකතු වෙලා යමක් කරමු කියලා යෝජනා කරමින්, මම නිහඬ වෙනවා. ස්තුතියි.

ගරු මන්ත්‍රී ධර්මසිරි ගනේවත්ත මහතා

ගරු සභාපතිතුමා ඇතුළු සියලු දෙනාගෙන් අවසරයි. ඇත්තටම මේ වෙලාවේ කතා කරන්න නොහිටියත් කතා කරන්න හිතුවා. මේ අවස්ථාවේ ඇති වී තිබෙන ව්‍යසනකාරී භාවයට මමත් හවුල් වුනානම්, සමාව භජනය කරනවා. මොකද මේ එළියෙ කෑගහන උද්ඝෝෂකයෝ පිරිස තමන්ගේ දුක වේදනාව පිට කරගන්න විදිහක් නැතුව කෑ ගහන්නෙ. නැත්නම් මෙතන ඇවිල්ලා උද්ඝෝෂණ කරලා රස්තියාදු වෙන වෙලාවක් නෙවෙයි. ඔවුන්ගේ කාලයෙන් ඔවුන්ගේ ගෙවල් වලට යම් කුලී වැඩක් හරි කරලා, හම්බ කරගන්න තියෙන වෙලාව තමයි මේ කැප කරලා තියෙන්නෙ. ආරක්ෂක අංශයේ රට රකින්න කියලා ගිය මට, දේශපාලනය කරන්න ආපු එක ගැන මම අද කනගාටු වෙනවා. දේශපාලනය නොකර මම ස්වාධීනව ඉන්නවිට, මගේ යහළුවන්ගේ ඉල්ලීම මත එක්සත් නිදහස් පක්ෂයේ සාමාජිකයෙක් බවට ටික කලක් පත්වෙලා හිටියාට පස්සේ, මගේ සහෝදර මන්ත්‍රී තරංග සුදර්ශන මන්ත්‍රීතුමා ඡන්දය ඉල්ලපු වෙලාවෙ එතුමත් එක්ක ප්‍රායෝගිකව වැඩ කළා. ඊට පස්සේ සරත් ෆොන්සේකා මහත්තයා වෙනුවෙන් ඡන්දය කලා. ඒ වගේ විවිධ අවස්ථාවලදී අවශ්‍යතාවය දැක්කා. ඒ තුළින් ආ ගමනක් විතරයි. මම ස්ථිරව මේ පක්ෂය කියන එක මට ඕනෙ නැහැ. 2015 මේ කතා කරන රනිල් වික්‍රමසිංහ අගමැති, මෛත්‍රීපාල සිරිසේන ජනාධිපති වෙච්ච රජයක් තිබුනත්, ඒ කාලෙදි මෙන්න මේ කියන පොහොට්ටුව නිර්මාණය වුනේ, පාස්කු ප්‍රහාරයෙන් පස්සේ. ඊට කලින් යම් ව්‍යසනයක් රටේ දකිනවා. ඒ තුළින් තමයි පොහොට්ටුව නිර්මාණය වෙලා එන්නේ. රනිල් වික්‍රමසිංහ මහත්තයා හොඳ නම්, අද දකින දැක්ම එදත් දකින්න ඕන. 2015 ඉඳන් පාලනය කරගෙන එද්දී, මම හිතන්නේ එතුමන් ඇතුළු, මම දකින කිසිම නායකයෙක් රට ඉස්සරහට කරගෙන යන්න තවම නැහැ. මට වූටි බලාපොරොත්තුවක් තියෙනවා තවම වර්තමාන ජනාධිපති ගෝඨාභය මහත්තයා ගැන. මොකද හමුදාව හිටපු කෙනෙක් විදිහට, මම ඇත්තටම දන්නවා. එතුමා මේ රට ආගාධයට දාලා යන්නෙ නැහැ කියන එක. මම එතුමා ගැන පොඩි බලාපොරොත්තුවක් තියෙනවා. මම කවදාවත් මගේ ගම් ප්‍රදේශ ගැන කතා කරලා නැහැ. ඇත්තටම මගේ දරුවන්ට දැනෙන බඩගින්න, ඔබේ දරුවන්ටත්, හැමෝටමත් දැනෙනවා. මීට මූලික අඩිතාලම දැම්මේ කවුද කියන එක, වර්තමාන දේශපාලන පක්ෂ තේරුම්ගන්න ඕන. ඔහු රට බාර ගත්ත දවසෙම ඉඳලා වාහන ගෙන්වීම වැලැක්වූවා. මොකද එතුමා දැක්කා. අනාගතයේදී මෙවැනි ප්‍රශ්න වලට මුහුණ දෙන්න වෙනවා කියලා. ඔහු විතරයි සමස්ත ඉතිහාසයේම රාජ්‍ය සේවකයෙක් ජනාධිපති වුණේ. ජනාධිපතිවරයාට නම්‍යශීලී නැති මන්ත්‍රී මණ්ඩලයක් වුණා. මම දන්නවා ඒක හොඳටම. පක්ෂයේ අයට එතුමගේ ගමන හරි ගියේ නැහැ. මොකද රාජ්‍ය සේවකයෙක් ලෙස ඔහු යම් යම් තනතුරු දෙන විට, අපේ කට්ටියටත් යම් යම් තනතුරු නැති වුණා. ජනාධිපති උපදෙස් දුන්න නමුත්, මම හිතන්නේ නැහැ. ඔවුන් ඒ දේම ක්‍රියාත්මක කලා කියලා. එහෙම නම් රටට මෙහෙම වෙන්නේ නැහැ. අපේ රටට අත් වුන ඉරණම සම්බන්ධයෙන්, මට හරිම වේදනාවයි. මම වගකිවයුත්තෙක් වෙනවනම්, රට හරි ගමනකට යවන පාලකයෙකුට, මම නිරන්තරයෙන් ශක්තිය දෙනවා. මේ රට හරියට ගොඩනගන්න පුළුවන් පාලකයෙක් පත්වුණොත් පමණක්, මම ඔහුට සහයෝගය දෙනවා. නමුත් මම එසේ කළ හැකි නායකයකු පත් වන තෙක්, මම ආ දේශපාලන ගමනත් එක්ක, එම පක්ෂයට සහයෝගය දෙනවා. හැබැයි දාලා යන්නේ නැහැ. ඒ වගේම අපේ සහෝදර මන්ත්‍රීවරුන්, විපක්ෂය ලෙස දුන් සහයෝගය මම අගය කරනවා. ඒ වගේම රටේ ව්‍යසනකාරී තත්ත්වයට මගේ දේශපාලන පක්ෂය දායකත්වයක් දුන්නා නම්, මම දුක් වෙනවා. සියළු දෙනාට සුබ පතමින්, මම නිහඬ වෙනවා.

ගරු උප සභාපති එම්.කේ. ගාමිණී සුසන්ත මහතා

ගරු සභාපතිතුමනි, මන්ත්‍රීවරුනි, මන්ත්‍රීවරියනි, සභාවේ අවසාන භාගයේ, රටේ ඇති වී තිබෙන අර්බුධකාරී තත්ත්වය පිළිබඳව, අදහස් දැක්වීමට බලාපොරොත්තු වෙනවා. සභාවකදී අපි කවුරුත් දන්නවා සභාවට අදාළව කතා කරලා, යෝජනා ස්ථිර කරලා. කටයුතු කරනවා. නමුත් අද සභාවේ දී රටේ පවතින දේශපාලන වාතාවරණය හා අර්බුදය පිළිබඳව දීර්ඝ වශයෙන් කරුණු කාරණා ප්‍රකාශ

කළා. ඒ සියල්ලට ඇහුම්කන් දුන්නට පස්සේ අපි කවුරුත් සභා කාලය තුළදී සභාවේ මන්ත්‍රීවරු සභාගර්භයේ ඉඳිද්දී තවත් උද්ඝෝෂකයො පිරිසක් ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරු පහළොස් දෙනාට විරුද්ධව උද්ඝෝෂකයෝ පිරිසක් මෙහෙයවනවා. ඒවගේම අපේ ජනතා විමුක්ති පෙරමුණේ මන්ත්‍රීතුමාලත් අපේ එක්සත් ජාතික පක්ෂයේ අනෙක් අයත් නිදහස් වෙනවා එතැනදී අපට පේනවා වරින්වර රංජිත් ජයවීර මන්ත්‍රිතුමාත් වනමල් මන්ත්‍රීතුමාත් මේ උද්ඝෝෂකයෝ අතරට ගිහිල්ලා නිරතුරුවම සහ සම්බන්ධතා පවත්වනවා. ඉතින් මට පේන්නෙ වනමල් මන්ත්‍රීවරයා ගේ හා රංජිත් ජයවීර මන්ත්‍රී වරයාගේ ආශිර්වාදය මේ උද්ඝෝෂකයින්ට නොඅඩුව ලැබෙනවා කියලා පෙනී යනවා. රතිඤ්ඤා මේ පැත්තට එනවා පොලිස් නිලධාරිනුත් යොදවල තියෙනවා. සභාව වේලාසනින් ආරම්භ වෙලා. උදේ 6.00 වන විට අපට උද්ඝෝෂකයෝ එනවා කියලා ආරංචි වුණා. සභාවට යම් පීඩනයක් ඇති කරන්න ගමේ හෝ කොට්ඨාශයේ හෝ රංජිත් මන්ත්‍රිතුමා කිව්වා තල්ගස්වලින් පිරිසක් එනවා කියලා. ශ්‍රී ලංකා නිදහස් පක්ෂය හැර සියලූ අය උද්ඝෝෂකයෝ අතර ඉන්නවලු. අපි මේක බලාපොරොත්තු වුණා. උදේ මේ තත්වයට මුහුණ දිය යුතු ආකාරය පිළිබඳවත් කතා කළා. අපට තිබුණා න්‍යායපත්‍රානුකූලව වැඩ කරලා, සභාව කල් තියන්න. නමුත් අපි එහෙම කළේ නැහැ. එන විදිහට මුහුණ දෙමු කියලා, මේ භූමියේදී අපට ආරක්ෂාව තියෙනවා. මෙතනින් ගියහම තමයි ඒ ආරක්ෂාව නැත්තේ. රටේ ප්‍රශ්නයක් තියෙනවා. ඒ නිසා මිනිස්සු පාරට බැස්සා. ඒ වගේම රටේ ජනාධිපති සමගත්, මුදල් ඇමති සමගත් ප්‍රශ්නයක් තියෙනවා. ඒක තමයි මිනිස්සු පාරට බැස්සේ. ඇත්තටම මහින්ද මහත්තයා දිනුවම ජාතික කොඩි අරගෙන පාරට බැස්ස වගේ, රටේ ප්‍රශ්න තියෙද්දී ඒ ආකාරයෙන්ම මිනිස්සු පාරට බැස්සා. කැබිනට් එක ඉවත් වෙලා තියෙනවා. ජනාධිපති සහ අගමැති ඉවත් වෙලා නැහැ. ඒ කියන කියන විදියට එතුමන්ලාට යන්න බැහැ. ඒවට පත්වෙන්නේ කොහොමද, ඉවත් වෙන්නේ කොහොමද කියලා. ව්‍යවස්ථාපිත නීතිරීති තියෙනවා. අද මේ වනවිට ජනාධිපතිවරයාගේ ගෙදරට ගහනවා. බලන්න ඕන. ඊළඟ පත්කරන ජනාධිපතිවරයගෙ ගෙදරටත් ගහනවා. ස්වාධීන වන අයටත් ගහනවා. ඒ අය ඊළඟට පත්වන අයටත් ගහනවා. මේක හොඳ ප්‍රවණතාවයක් නෙවෙයි. ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ට මේ තර්ජනය ගමේදී, ගමේ දෙයක් බෙදනකොට ඒක හැමෝටම කරන්න බැහැ. එවිට ගම්වල අපට පක්ෂව දීපු අයත්, විපක්ෂව දීපු අයත් තරහා වෙනවා. ආණ්ඩුවේ ක්‍රියාකලාපය ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හරහා බෙදාගෙන ගියා. ඒ වගේම බැන්නොත් ඒකත් අහනවා. හූ කිව්වොත් ඒකත් අහනවා. ඇමතිවරු, කැබිනට් එකක් පිළිබඳ ප්‍රශ්නයක් තියෙනවා. ඒ අය ආණ්ඩුව, කැබිනට් එක, අගමැතිවරයා, ජනාධිපතිවරයා අයින් වෙන්න කියලා මිනිස්සු පාරට බැහැලා, එක එක දේවල් තීන්දු කළා. එහෙම කරන්න පුළුවන් නම් අපි 15දෙනා ආන්ඩුවේ පක්ෂය වශයෙන් අපට ප්‍රශ්නයක් නැහැ. රටේ ජනතාව මහින්ද රාජපක්ෂ මහත්තයා එදා යුද්ධය දිනලා ආව වගේම, ජාතික කොඩිය අරගෙන තමයි පාරට බැහැලා විරුද්ධව කෑ ගහන්නෙ. අපේ ගමේ ළමයි දෙන්නෙක් පැල වගයක් දුන්නේ නෑ කියලා මාත් සමඟ වෛරයක් ඇති කර ගෙන තියෙන්නෙ. මම කිව්වා ඊළඟ ලයිස්තුවට දාලා දෙන්නම් කියලා. ගමේ දේවල් බෙදන්න ගියාම ප්‍රශ්න තියෙනවා. විසිපන්දාහ බැගින්, ගෙවල්වලට සිමෙන්ති දුන්නා. වැසිකිළි ආධාර ලබා දුන්නා. ලක්ෂ හය හමාරක් පමණ වැය කරලා, තවත් ගෙවල් ගමේ හැදෙන කොට, හාර පන්සීයකට ගමේ අයට උදව් කරද්දී, ගමේ සීයක්, දෙසීයක් තරහ වෙන එක ප්‍රශ්නයක්. නොලැබිච්ච අපේ අයත් තරහ වෙනවා. ඒ වගේම අපට විරුද්ධව ඡන්දය දීපු අයත් තරහ වෙනවා. නමුත් අපි ඒක කරගෙන ගියා. අපි එකේ හොඳද නරකද, අඩුපාඩුද කියන එක පිළිබඳව, ප්‍රතිඵලය මෙතැන කෑ ගහනවා වගේ, ගමේ ගොඩේ හන්දියට බැස්ස වගේ විසඳෙන්නේ නැහැ. ඒවට ප්‍රජාතන්ත්‍රවාදී ක්‍රමවේද තියෙනවා. කුරුඳු පැල, කුකුල් පැටව්, ගෙවල් හදලා දුන්නෙ නැහැ කිව්වම, ඒ ප්‍රශ්න ටික අපට ගමේදි විසඳගන්න පුළුවන්. අපේ මේ පීඩනයට පත් වුණ මන්ත්‍රීතුමන්ලාට මම උදෙත් කිව්වේ, ඒවට අපි මුහුණ දෙන්න ඕනි කියලා. එනිසා ජනාධිපතිවත් අගමැතිවරු අපහසුතාවයකට පත් කරන්නවත්, අතරමං කරන්න අපි උත්සාහ කරන්නේ නැහැ. එතුමන්ලත් එක්ක කටයුතු කරන්න බැරි නම්,

දේශපාලනයෙන් සමුගෙන අපි ගෙදරට වෙලා ඉන්නවා. ඒක වෙනම කතාවක්. ඒක ප්‍රජාතන්ත්‍රවාදය අද වන විට පාර්ලිමේන්තුවේ අසමතුලිතතාවයක් පවතිනවා. අගමැතිවරයාට අකමැති නම්, ඡන්දයක් තියලා, නව අගමැතිවරයෙක් පත් කර ගනීවි. ඒ නව අගමැතිවරයාට අවශ්‍ය පරිදි කැබිනට් එකක් පත් කර ගනීවි. ඊට පස්සේ එන කැබිනට් එකට රට කරගෙන යාමේ බලය තියෙනවා. පහුගිය දවස්වල විවිධ අවස්ථාවන්වලදී, විවිධ කණ්ඩායම් උද්ඝෝෂණය කරනවා. ඔවුන් අයින් කරලා දාන අයටත් වෙන්නෙ, IMF එක පස්සේ යන්න. සජිත් මහත්තයා කිව්වා මට රටවල් හතරකින් තෙල් දෙනවා කියලා. මමත් අත්සන් කරලා දෙනවා. මොකද රටවල් හතරකින් තෙල් දෙනවනම් එක ලේසි වැඩක්ද?

තව තවත් ප්‍රශ්න වැඩිවෙනවා මිසක් කරන්න බැහැ. සැලසුම් කරපු තෙල් නැව් එන්නත් පුළුවන්. සැලසුම් කරපු ආධාර එන්නත් පුළුවන්. සමෘද්ධිය අඩු කරන්න, රැකියාවන් අඩු කරන්න කියයි. IMF එකෙන් ඇවිල්ලා අපේ ආධාර බෙදන ඒවා අඩු කරන්න කියයි. ඒ මිනිස්සු රට බාර ගනීවි. ඒ මිනිස්සු කියන විදිහට රට කරන්න වෙයි. ඒ ආර්ථිකයට ඇත්තටම මුහුණ දෙන්න වේවි. අපි පක්ෂයක් වශයෙන් වගකීමක් ඇතිව ඉදිරියට කටයුතු කරන්න බලාපොරොත්තුවෙන්, අපි යම් අරමුණක් ඇතිව අපි කියනවා. මේ අවස්ථාවේ දී යම් පුද්ගලයෙක්, මේ කැරැල්ල මෙහෙය වූවානම්, එහි වගකීම ගන්න කියලා. ඒ වගේම අපි කියලා දෙනවා. සමගි ජන බලවේගයටත්, ජනතා විමුක්ති පෙරමුණටත්, මේ මොනව කළත්, ඔබතුමන්ලා කවද හරි බලයට එන්න පුළුවන් වුණත්, හමුදා පාලනයකට යන්නේ නැහැ. ඒකාධිපති පාලනයට යන්නේ නැහැ. මේ මැතිවරණය වෙනස් කරන්න බැහැ. ජනාධිපතිවරණයක් තිබුණත් 51% ක් ගන්නත් ඉතාමත් අමාරු වෙයි. සියලු දෙනාට සුභ අනාගතයක් ප්‍රාර්ථනා කරමින්, මම නිහඬ වෙනවා.

ගරු සභාපතිතුමාගේ මූලාසන කතාව

ගරු උපසභාපතිතුමා ඇතුළු සමස්ත මන්ත්‍රීවරුන්ගෙන් අවසරයි. ගරු මන්ත්‍රීවරුනි, අද 2022 අප්‍රේල් 05 දින, මීට වසර 51කට උඩදී, එනම් 1971 අප්‍රේල් 05 දින, මෙතන ඉන්න මන්ත්‍රීවරුන්ට සිහිපත් කරන්න කැමතියි. හිටපු සභාපති, ගරු මන්ත්‍රී සහබන්දු මහතාට නම් මතක ඇති. එදා ඒ කාලයේ හිටපු අගමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියට විරුද්ධව, තරුණ කැරැල්ලක් ඇති වුණේ එදා. අද වැනි දවසක රජයට විරුද්ධව, අවි ආයුධ ගත් තරුණ පිරිස කැරලි කර, රජය අපහසුතාවයට පත් කළා. අග්‍රාමාත්‍ය සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය, තමන්ගේ මනුසත්කම ලෝකයට විදහා දක්වමින්, තරුණ කැරලිකරුවන්ගේ ජීවිතය සුරක්ෂිත කරමින්, මනා ලෙස එම කැරැල්ල මැඩ පැවැත්වූ ආකාරය අපට සිහිවනවා. මමත් ඒ කාලයේ පොඩි ළමයෙක්. ආවේගශීලී සමහර තරුණ තරුණියන් තමන්ගේ ජීවිතය පූජා කළා. ඒවා අපගේ දෑසින් දැක්කා. දැනුත් රටේ ඇති වී ඇත්තේ, අවි ආයුධ වලින් තොර, එවැනි ආකාරයේ කැරැල්ලක්ද කියා මට හිතෙනවා. එදා මැතිණිය රටේ බලය ලබාගෙන අවුරුද්දයි ගතවුණේ. කැරැල්ල ආවා. මෙදා ගෝඨාභය ජනාධිපතිතුමා බලය ලබාගෙන අවුරුදු දෙකයි. නොසිතූ ලෙස උද්ඝෝෂණ අරගල පවත්වනවා. මේවා සාමකාමී උද්ඝෝෂණ ලෙස පෙනුනත්, මේ පිටුපස යම් යම් බලවේග හොල්මන් කරන බව අපට පැහැදිලියි. නායකත්වයක් නොමැති බව කීවත්, මේවට සහාය දක්වන අය දිහා බැලුවම, අපට පේනවා. එය සත්‍ය නොවන බව. අදත් අප සභාව ඉදිරිපස උද්ඝෝෂණයක් සිදු කරන අය දිහා බැලුවම, එය අපට වැටහෙනවා. රටේ පවතින වර්තමාන අර්බුදකාරී වාතාවරණය, දඩමීමා කරගෙන, පසුගිය මැතිවරණයේදී අන්ත අසරණ වුන, දේශපාලන පක්ෂ නැවත අලු ගසා නැගිට ගන්න, මෙය අවස්ථාව කරගෙන තියෙනවා. අද මෙම උද්ඝෝෂණ පිළිබඳව, මාව දැනුවත් වූවාට පසුව, අද උදෙත් මට දුරකථන ඇමතුමක් දීලා ඇහුවා. නියාගම සමගි ජන බලවේගයේ හිටපු මන්ත්‍රීතුමකු, සභාපතිතුමා අද සභාව තියෙනවද? සභාව ඉදිරියේ උද්ඝෝෂණයක් තියෙනවද? අපිත් එන්නද කියලා ඇහුවා. මම ඔහුට කිව්වා. මටත් ආරංචිය ආවා. ඔයාලත් ඇවිත් සාමකාමීව සහය දෙන්න කියලා. අද ඇවිත් ඇති. අපේ ආණ්ඩුවට පින්සිද්ද වෙන්න,

සාමකාමී උද්සෝෂණ කිරීමට ඕනම අයෙකුට අයිතිය ලබා දීලා තියෙනවා. ඔබ අපට මතකයිනෙ. 1983 ජූලි උද්සෝෂණ වර්ජන. අසූ දාහක් රජයේ සේවකයින් ගෙදර යැව්වා.

ගරු මන්ත්‍රීවරුනි, ඒ අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා අපි රටේ ජනාධිපති කළේ මහත් බලාපොරොත්තු රාශියක් ඇතිව. මොනවද ඒ බලාපොරොත්තු? තද පාලනයක්, හොරකම, වංචාව, දූෂණයෙන් තොර, සියලු ලාංකිකයන්ට රිසිසේ ජීවත් වීමට හැකි සෞභාග්‍යමත් රටක්. තරුණ දරුවන් වෙලාගෙන ඇති මත් රකුසා නැති රටක්. ඒ බලාපොරොත්තු සියල්ල කෙමෙන් කෙමෙන් ඉටු කරන මොහොතේ, තමයි ලොවම වෙළාගත් කොවිඩ් වසංගතය ලංකාවට අයහපත් ලෙස බලපෑවේ. එයින් ඇතිවූ අයහපත් ප්‍රතිඵල තමයි අද අපි කවුරුත් භුක්ති විඳින්නේ. රටේ ආර්ථිකය බින්දුවට බැස්සා. අප රටට අවශ්‍ය, අත්‍යවශ්‍යම ද්‍රව්‍ය තෙල්, gas, පොහොර, බෙහෙත් අත්‍යාවශ්‍ය ආහාර වැනි දේ ගෙන්වීම පමා වීම තුළ, විශාල ලෙස ජනතාව අපහසුතාවයට පත් වීම තුළ, ඔවුන් රජයට එරෙහිව පක්ෂ භේදයකින් තොරව නැගී සිටියා. එය තමයි මේ වෙනකොට සිද්ධ වෙමින් තියෙන්නෙ. මේ අවස්ථාවේ, අවස්ථාවාදීන් එයින් උපරිම ප්‍රයෝජන ගනිමින් සිටිනවා. අද සභාව ඉදිරියේ සිදුවුණේ එවැනි දෙයක්. ගරු මන්ත්‍රීවරුනි, මේවා අපට නොතේරෙනවා නෙවෙයි. සියලුම ප්‍රශ්න අපටත් පොදුයි. නමුත් අපි කල්පනා කරන්න ඕන. ගෝඨාභය Go කියනකොට, ගෝඨාභය නොහිටින්න, උද්සෝෂණය කරන්න මිනිස්සු කොයින්ද කියලා. එතුමාට පින්සිද්ධ වෙන්න ලංකාවේ 80% කට කොවිඩ් එන්නත, නොගත්ත නම්, උද්සෝෂණ කරන්න ගෙදරින් එළියට එන්න බැහැ. ඇමරිකාවේ, එංගලන්තයෙ, ඉතාලියේ වගේ පාරවල් වල, මැරී වැටෙන්න තමයි සිද්ධවෙන්නේ. තවමත් ඒ රටවල්වල පෙර පරිදිම වසංගත තත්වය ඉවර නැහැ. ප්‍රභාකරන් කිව්ව වගේ, සිංහලයට මතක තියෙන්නේ දවස් දාහතරයි. අද සිංහ කොඩිය උද්සෝෂණවල ලෙල දෙනවා. මුළු ශ්‍රී ලංකාවේම සිංහ කොඩිය ලෙළ දෙන්න, රට එක්සේසත් කළේ රාජපක්ෂවරු කියලා අමතකයි. පසුගිය කාලයේ රට පාලනය කළ සියලුම ආණ්ඩු තුළින් හොඳ නරක දෙකම රටට සිදු වුණා. 1948 නිදහසින් පසු, අපේ රට වැඩිම ව්‍යාකූල තත්වයට පත් වූ කාල වකවානුවක් මේ අපි ගෙවන්නේ. 58 හර්තාල් ව්‍යාපාරය, 71 චේගුවේරා කැරැල්ල, 83 කළු ජූලිය, 88/ 89 තරුණ කැරලි, වගේම තිස් අවුරුදු එල්ටීටීඊ යුද්ධය. මේ සියල්ලට වඩා වැඩි බලපෑමක් ඇති වූ කාලවකවානුව තමයි මේ වකවානුව. අද අපට වෙලා තියෙන්නේ, 77 වූ දේශපාලන පෙරලියේ වෙනස භුක්ති විඳින්න. ඇයි මම මෙහෙම කියන්නේ. ගරු මන්ත්‍රීවරුනි, 1977 ට පෙර ලංකාවෙ නිෂ්පාදන පිට රටට ගියා. යුනික් රේඩියෝව හැදුවා. කිඹුලා උදැල්ල හැදුවා. අපට අවශ්‍ය රෙදිපිළි අපේ රටේම හැදුවා. කැළණි ටයර් නමින් ටයර් හදා, පිටරට ඇරියා. අපට අවශ්‍ය බොහොමයක් ආහාර ද්‍රව්‍ය මෙහෙම වගා කළා. අද ඒවා කෝ? 1977 න් පසු විවෘත ආර්ථිකයත් සමග මේවා වැනසී ගියා. අද ඉදිකට්ටේ ඉඳන් සරුංගලය, වෙසක් කූඩුව දක්වා භාණ්ඩ පිටරටින් ගේන්නේ. අපේ රටේ සල්ලි පිටරටට ගියා. උදාහරණ යුනික් රේඩියෝව හැදුවා. පූගොඩ, තුල්හිරිය වැනි රෙදිපිළි කර්මාන්ත ශාලාවලින් රටට අවශ්‍ය රෙදිපිලි නිෂ්පාදනය කළා. ලංකා ලෝහ සංස්ථාව වැනි ආයතන විසින් අපට අවශ්‍ය යකඩ ටික, ගොවි උපකරණ කිඹුලා උදළු ආදිය නිෂ්පාදනය කළා. රටේ නිෂ්පාදනය කරන රබර් කිරි වලින් ටයර් නිෂ්පාදන කැලණි නමින්, පිටරට යැව්වා. මේ සියලුම දේවල් 1977 විවෘත ආර්ථිකය හඳුන්වා දීමෙන් පසුව වැනසී ගියා. නැතිනම් ඕන කමින්ම වසා දැමුවා. මෙහි ප්‍රතිඵල තමයි අද අප භුක්ති විඳින්නේ. අපට විදේශ විනිමය ගෙන ආ සියලුම නිෂ්පාදන, පිටරටින් ගෙන එන කොට, ඩොලර් අපට නැති වෙනකොට, පිටරටින් ණය ගත්තා. ඒ ණය ගෙවන්න, තවත් ණය ගත්තා. ණය දෙන රටවල් අපට නොයෙක් සම්බාධක පැනෙව්වා. ඔවුන් අපේ වටිනා සම්පත්වලට කෑදර වූවා. දේශපාලන වාසි තකා, අපේ දේශපාලන නායකයින් ද, දැන හෝ නොදැන මේවට එකඟතාවය දැක්වූවා. සමහර අවස්ථාවල රටට ආදරය ඇති නායකයින් මේවාට විරුද්ධ වූවද, ඒවා ප්‍රතිවාදීන් විසින් වැළැක්වූවා. එල්ටීටීඊ වැනි මිලේච්ඡ ත්‍රස්තවාදීන් බිහි කොට, සුන්දර ලංකාව ලේ විලක් කළා. මේ රටේ වටිනා සම්පත්, තමන් අතට පත් කරගන්න විදේශ බලවේග ක්‍රියාත්මක වීම තුළ, අපේ රටේ අනාගතය මෙහෙයවීම, විශාල අභියෝගයක්. ඒ අභියෝගය ජයගන්න තමයි. අපි 69 ලක්ෂයක් ඡන්දය දීලා, ගෝඨාභය මැතිතුමා ජනපති කලේ. දැන් බලන්න පකිස්ථානය දිහා. ඒ රටට විශාල ජනවරමකින් නව නායකයකු පත්කළා. ඉම්රාන් ඛාන් කියලා. ඔබ අපි කවුරුත් දන්නා ලෝක ප්‍රසිද්ධ ක්‍රිකට් නායකයා,

එතුමා ආ විගස මොකද කළේ? තමන්ගේ වියදම් කපා හැරියා. අපගේ ජනාධිපතිතුමා වගේ වංචාව, දූෂණය නැවැත්තුවා. දේශප්‍රේමීත්වයට ගරු කළා. අසල්වැසි රාජ්‍යයන් සමඟ කුළුපග වුණා. මෙය බලා ඉන්න බැරි විදේශ බලවේග, එතුමා බලයෙන් නෙරපන්න කටයුතු කළා. අපේ රටෙත් කරන්නේ ඒ ටිකමයි. නමුත් මතක තියාගන්න gogo ගෝඨාභය කියන අයම come,come ගෝඨාභය කියන දවස ඈතක නෙමෙයි කියලා මතක තියාගන්න. මෙවැනි කුමන්ත්‍රනවලින් බලය ලබාගත් රටවල් , අද අන්ත අසරණ දුගී භාවයට පත්වෙලා. උදාහරණ, ඉරාකය, ලිබියාව වැනි රටවල්. අපේ රටට, එහෙමත් නැත්නම් ශ්‍රී සම්බුද්ධ ශාසනය රැක ගෙන සිටින අපේ මවුබිමට, එවැනි තත්ත්වයක් උදා නොවේවා කියා පතමින්, සහ අද දින සභාවට පැමිණ, තමන්ගේ හදවතේ ඇති කැකෑරෙන රටේ ප්‍රශ්න සභාවට ඉදිරිපත් කරමින්, මේවායින් මිදිය යුතු ආකාරය සහ රටේ නායකයින් ගතයුතු ක්‍රියාමාර්ග පැහැදිලි කරමින්, කතා කළ සියලුම මන්ත්‍රීතුමන්ලා, මන්ත්‍රීතුමියන්ලා ඇතුළු සියලුම දෙනාට සුභ අලුත් අවුරුද්දක් වේවායි පතමින්, මම නිහඬ වෙනවා.

සභාපති,
නාගොඩ ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේදී                    දිනය:-